හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

84T

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු

-2 JUL 2009

HARTI Annual Report Sinhala 2007

# වාර්ෂික වාර්තාව
# 2007

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

8147

ආයතනය
-2 JUL 2007
කොළඹ.

# වාර්ෂික වාර්තාව
# 2007

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත,
කොළඹ 07.

# පටුන

**පිටු අංක**


| | |
|---|---|
| සමෝධානය | 1-3 |
| පාලක මණ්ඩලය | 4-5 |
| කෘෂිකාර්මික ප්‍රතිපත්ති සහ ව්‍යාපෘති ඇගයීම් අංශය | 6-10 |
| කෘෂිකාර්මික හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශය | 10 |
| වාරි, ජල කළමනාකරණ සහ ගොවිජන සම්බන්ධතා අංශය | 10-11 |
| අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය | 11-17 |
| සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය | 17-23 |
| මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය | 23-25 |
| 2007 දෙසැම්බර් 31 වන දිනට කාර්ය මණ්ඩල තත්ත්වය | 26 |
| කාර්ය මණ්ඩල සංවර්ධනය | 26-27 |
| ගිණුම් | 28-36 |
| විගණන වාර්තාව | 37 |

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු
පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය,
114, විජේරාම මාවත,
කොළඹ - 07.
2008. 07. 31

කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමා
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය
'ගොවිජන මන්දිරය',
80/5, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

අමාත්‍යතුමනි,

**2007 වාර්ෂික වාර්තාව හා විගණනය කරන ලද ගිණුම්**

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) වගන්තිය පරිදි 2007 දෙසැම්බර් 31 වැනි දිනට අවසන් වූ වර්ෂය සඳහා මෙම ආයතනය සම්බන්ධයෙන් පහත සඳහන් ලේඛන ආයතනයේ පාලක මණ්ඩලය වෙනුවෙන් මේ සමග ඉදිරිපත් කරමි.

1. වාර්ෂික වාර්තාව
2. විගණනය කරන ලද ආදායම් හා වියදම් ගිණුම්
3. විගණනය කරන ලද ශේෂ පත්‍රය
4. ගිණුම් පිළිබඳ විගණකාධිපතිගේ නිරීක්ෂණය.

මෙයට විශ්වාසී,

..............................................
සභාපති
පාලක මණ්ඩලය

## සංස්ථාපනය

1972 අංක 05 දරන ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන පනත යටතේ
1972 වර්ෂයේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
පිහිටුවනු ලැබ ඇත. මූලික අවස්ථාවේ දී ආයතනය වෙත
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන/ආහාර හා
කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥ දායකත්වය සහ මූල්‍ය සහයෝගය ලැබුණි.
නිල බලයෙන් පත්වන කෘෂිකර්ම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, පාලක මණ්ඩලයේ සභාපති වශයෙන්
මෙම ආයතනය පාලනය කරයි. රටේ කෘෂි ක්ෂේත්‍රයේ සංවර්ධනයට මුල්වන ආයතනයන්ගේ
නියෝජිතයන්ගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ.
අධ්‍යක්ෂවරයා ආයතනයේ ප්‍රධානියා සහ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන්
පාලක මණ්ඩලයේ සාමාජිකත්වය දරයි.

ආයතනයේ අරමුණු රාශියකි. රටේ සමාජ - ආර්ථික පර්යේෂණ ක්ෂේත්‍රයේ ප්‍රමුඛයා වශයෙන්
ජාතික සහ ජාත්‍යන්තර ආයතන මගින් කරනු ලබන ගොවිජන ක්ෂේත්‍රයේ පර්යේෂණ වැඩි දියුණු කිරීම,
සහයෝගය දීම, දිරි ගැන්වීම සහ සහභාගිත්වය ලබාදීම හෙ.ගො.ප.පු. ආයතනයේ අපේක්ෂාවයි.
තවදුරටත්, ගොවිජන ක්ෂේත්‍රයේ ගැටලු සඳහා ප්‍රතිපත්තිමය නිර්දේශයන් සැපයීම අරමුණු කර ගෙන
ආයතනය මගින් පර්යේෂණ හා විමර්ශන කටයුතු ඉටු කිරීමට අපේක්ෂා කරයි.
පර්යේෂණයන්ට අමතරව, ජාතික, කලාපීය සහ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ/වැඩමුළු
සහ පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි. සමස්තයක් වශයෙන් ආයතනය ගොවිජන ගැටලු සම්බන්ධ
තොරතුරු එක්රැස් කිරීමේ හා බෙදාහැරීමේ කේන්ද්‍රස්ථානයක් ලෙස ක්‍රියාත්මක වේ.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පහත සඳහන් දැක්ම,
මෙහෙවර සහ ඉලක්ක ආයතනය සතු වේ.

## දැක්ම

තිරසර ගොවිජන සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා දැනුම ජනනය සහ
බෙදාහැරීමේ ප්‍රමුඛයා බවට පත්වීම.

## මෙහෙවර

සමාජ-ආර්ථික පර්යේෂණ සහ පුහුණු ක්‍රියාකාරකම් ඔස්සේ ගොවිජන සහ
ග්‍රාමීය අංශය ශක්තිමත් කිරීම.

## ඉලක්ක

1. දැනුම ජනනය සහ නියමිත වෙලාවට බෙදා හැරීම මගින් ප්‍රතිපත්ති ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කිරීම.
2. පුහුණු කිරීම් තුළින් ග්‍රාමීය සංවර්ධන පාර්ශවකරුවන්ගේ හැකියාවන් වැඩි දියුණු කිරීම.
3. ක්‍රියාබද්ධ පර්යේෂණ තුළින් ග්‍රාමීය සංවර්ධන ආදර්ශයන් සැකසීම.
4. සැපයුම් ක්‍රියාවලිය තුළ සිටින පාර්ශවකරුවන් සඳහා වෙළඳපොළ බුද්ධි තොරතුරු සැපයීම.
5. ආයතනයේ සම්පත් කළමනාකරණය වැඩි දියුණු කිරීම.

# වාර්ෂික වාර්තාව - 2007


## සමෝධානය

2007 වර්ෂයේ සිට පසුගිය 35 වසරක කාල පරිච්ඡේදය විමසා බැලීමේදී ගොවිජන ගැටළු සම්බන්ධයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති දියත් කිරීමේදී පර්යේෂණ තුළින් විශාල දායකත්වයක් ලබාදීමට අපට හැකියාව ලැබුණි. 2007 වසරේ කැපී පෙනෙන කරුණක් වූයේ ආහාර ද්‍රව්‍යයන්ගේ මිල වේගවත්ව ඉහළ යාමයි. ජාතියේ ප්‍රධාන ආහාරය වන සහල් මිල පෙර නොවූ අයුරින් ඉහළ ගියේය.

**සහල් මිලෙහි ප්‍රවණතා**

සාමාන්‍යයෙන් සහල් මිල ඉහළම අගයක් ගනු ලබන්නේ වසර අග භාගයේදී ය. ඒ දීප ව්‍යාප්තව පවතින සහල් තොග මට්ටම අඩුවීම නිසාවෙනි. 2007 ඔක්තෝබර් මාසයේ සිට පැවති තියුණු මිල වැඩිවීම රූප සටහන් 1 සහ 2 මගින් දක්වයි. ඉන් අනාවරණය වන ආකාරයට ඒ පිළිබඳ උනන්දු වන පිරිස අතර සියුම් කම්පනයක් ඇති කිරීමට මෙම කරුණ සමත් විය. තියුණු ලෙස සහල් මිල වැඩිවීම කෙරෙහි බලපෑ හේතු සමූහයකි. 2006 වසර සමග සැසඳීමේදී 2007 වසරේ වී නිෂ්පාදනයෙහි 7% ක අඩුවීමක් වාර්තා වේ. 2006/2007 මහ කන්නයේ වගා කල භූමි ප්‍රමාණය 11.15% කින් අඩු වී පැවති අතර 2007 යල කන්නයේ එය 8.65% ක අඩුවීමක් සේ ගණනය කොට ඇත. සමස්ත නිෂ්පාදනයෙන් 9%ක දායකත්වයක් පෙන්නුම් කරන මඩකලපුව ප්‍රදේශයේ වගා කළ භූමි ප්‍රමාණය මහ කන්නයේ 60%කින් ද යල් කන්නයේ 82%කින් ද අඩු වී තිබුණි. කඩින් කඩ වර්ෂාව ඇද හැලීමෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ වගා කළ භූමි ප්‍රමාණය මහ කන්නයේ 6.8%කින් හා යල කන්නයේ 30.9%කින් අඩු විය. කුරුණෑගල ප්‍රදේශයේ මෙම අඩුවීම මහ කන්නයේ 2.1% සහ යල කන්නයේ 18.1% කි.

රූප සටහන 01 : කොළඹ සම්බා සහල් සිල්ලර මිල - 2006 සහ 2007





මූලාශ්‍රය : හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

තිරිඟු පිටි මිල ඉහළ යාම ද සහල් වෙළඳපොළට බලපා ඇත. පසුගිය වසර දෙක තුළ දී තිරිඟු පිටි මිල 123%කින් ඉහළ ගොස් තිබේ. ශ්‍රී ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට, 2007 වසරේ දී තිරිඟු පිටි කිලෝ ග්‍රෑමයක මිල අභිබවා සහල් මිල ඉහළ ගොස් තිබුණි. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ සමීක්ෂණයකට අනුව, කොළඹ සහ අවට ප්‍රදේශයේ සිල්ලර වෙළඳුන් අතර තිරිඟු පිටි අලෙවිය 55%කින් අඩු වී තිබුණි. එකී සමීක්ෂණයෙන් අනාවරණය වන ආකාරයට පිටස්තර ප්‍රදේශයන්ගේ තිරිඟු පිටි අලෙවිය 90%කින් පහත බැස ඇත. තවදුරටත් එකී අධ්‍යයනයෙන් අනාවරණය වන ආකාරයට කොළඹ ප්‍රදේශයේ සහල් අලෙවිය 58%කින් වැඩි වී තිබුණි.

සත්ත්ව ආහාර සැකසීම සඳහා සහල් තොග යොදා ගැනීම ද සහල් මිල ඉහළ යාම කෙරෙහි දායකත්වයක් සපයා ඇත. මේ සඳහා හම්බන්තොට, පොළොන්නරුව, අම්පාර, සහ මඩකලපුව යන දිස්ත්‍රික්කයන්ගේ වී තොග මිල දී ගෙන ඇති බවට තොරතුරු ලැබී ඇත. ජාත්‍යන්තර වශයෙන් ජෛව ඉන්ධන නිපදවීම වෙත ආහාර ධාන්‍ය තොග සැපයුම තල්ලු වෙමින් පවතී. එතනෝල් නිෂ්පාදනයට සහනාධාර සැපයීම නිසා, විශේෂයෙන්ම ඇමරිකා එක්සත් ජනපදයෙහි ගොවීන් දහස් ගණනින් ආහාර බෝග වගාවෙන් ඉවත්වීම විද්‍යාමාන විය. ගෝලීය වශයෙන් ඉරිඟු මිල ගණන් වැඩි වීම, ලාභදායි විකල්පයක් ලෙස සහල් යොදා ගැනීමට බලපා ඇත.

ආනයනික සහල් මිල ඉහළ යාම ද, දේශීය සහල් මිල වැඩිවීම කෙරෙහි දායකත්වය සපයයි. 2007 කාල වකවානුවේ දී, ලෝක වෙළඳ පොළේ සහල් මෙ.ටො. 01 ක් ඇමරිකන් ඩොලර් 275 සිට 350 දක්වා ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස ආනයනය කරන ලද සහල් කිලෝවක CIF මිල රු. 45/- දක්වා වැඩි වී තිබුණි. 2006 සහ 2007 වර්ෂයන්ගේ සම්බා සහ නාඩු සහල් ප්‍රභේදයන්ගේ මිල හැසිරීමේ ප්‍රවනතාවය රූප සටහන් අංක 1 සහ 2 මගින් පෙන්නුම් කෙරේ.

රූප සටහන 02 : කොළඹ නාඩු සහල් සිල්ලර මිල - 2006 සහ 2007




මූලාශ්‍රය : හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

ආහාර මිල ගණන් පුරෝකතනය කිරීම ඉතා උගහටය. ගොවීන්ගේ ඉපැයීම් වලට වඩා වැඩි වේගයකින් ආහාර ද්‍රව්‍යයන්ගේ මිල ඉහළ යමින් තිබේ. අපි වවමු - රට නගමු යන දේශීය ආහාර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක රජය නිරතව සිටීමේ අවශ්‍යතාවය හා වැදගත්කම මේ අනුව ඉතා පැහැදිලි වේ.

මෙම ජාතික ගැටලුව පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා, ගොවීන්, මෝල් හිමියන්, ආනයනකරුවන්, සිල්ලර වෙළඳුන්, පාරිභෝගිකයන් සහ රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානයන් හි නිලධාරීන් සමග වැඩමුළුවක් පවත්වන ලදී. මෙම වැඩමුළුවේ දී නිෂ්පාදනය අඩුවීම, තිරිඟු පිටිවල සිට සහල් දක්වා පාරිභෝගිකයන් මාරුවීම, සහල් සත්ත්ව ආහාර ලෙස භාවිතා කිරීම සහ සහල් සඳහා වන ඉහළ ලෝක වෙළඳපොළ මිල ගණන්, සහල් මිල අසාමාන්‍ය ලෙස වැඩිවීම කෙරෙහි හේතු වී ඇති බව අනාවරණය විය. තව ද, රටෙහි පවතින වී/සහල් තොග තත්ත්වය අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් ඇති කරලීමේ අවශ්‍යතාවය සහ රාජ්‍ය, පෞද්ගලික අංශය හෝ ගොවීන් විසින් අවම තොග මට්ටමක් පවත්වාගෙන යාමේ වැදගත්කම ද වැඩමුළුවේ දී අවධාරණය කරන ලදී.

2007 වර්ෂයේ දී, පර්යේෂණ අධ්‍යයනයන් නවයක් සම්පූර්ණ කිරීමේ හැකියාව ලැබුණි. ඉන් පහක් ආයතනය විසින් ආරම්භ කළ අතර අනෙකුත් අධ්‍යයනයන් පිටතින් ආයතනයට ලැබී තිබුණි. ඊට අමතරව, රට තුළ විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දීමෙන් පසු අලෙවි කටයුතු අධීක්ෂණය පිණිස 1979 දි ආරම්භ කළ ආහාර සහ අලෙවි තොරතුරු වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක වේ. සම්පූර්ණ කළ පර්යේෂණ අධ්‍යයනයන්, ඇගයීම් (5) සවිස්තරාත්මක (3) සහ කාලීන අවශ්‍යතාවයන් හේතු කොට ගෙන කරනු ලබන පර්යේෂණ අධ්‍යයනයන් (1) වශයෙන් වෙන් කළ හැකිය. සම්පූර්ණ කළ ඇගයීම් අධ්‍යයනයන් අතර දේශීය කෘෂි අංශය කෙරෙහි බලය බෙදීම බලපා ඇති ආකාරය ඇගයීමේ අධ්‍යයනය, ආයතනයේ මූලිකත්වයෙන් ආරම්භ කළ නවතම පර්යේෂණ අංශයකි. මෙම අධ්‍යයනයෙන් අනාවරණය වූ ආකාරයට කෘෂිකර්මය පළාත් සභා වෙත පැවරුන විෂයයක් වුව ද, ඔවුනට වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා මානව සහ මූල්‍ය සම්පත් හිඟයක් පවතී. විශේෂයෙන්ම, කෘෂි ව්‍යාප්ති කටයුතු වල දී, පළාත් සභා සතුව ග්‍රාමීය මට්ටමට අයත් ව්‍යාප්ති නිලධාරීන් නොමැති කම සඳහන් කළ හැකිය. කෘෂි රක්ෂණ යෝජනා ක්‍රම ඇගයීමේ අධ්‍යයනයෙන් අනාවරණය වන්නේ ගොවීන් කෘෂි රක්ෂණය සම්බන්ධයෙන් උනන්දුවක් නොදක්වන බවයි. ගොවීන් ඒ සඳහා දායක වී තිබුනේ එය බැංකු ණය ලබා ගැනීම සඳහා මූලික අවශ්‍යතාවයක් වූ නිසාය. කෘෂි රක්ෂණයට දායක වූ ගොවීන්ගෙන් 99% ක්ම බැංකු ණය ලබාගෙන තිබීමෙන් මෙය පැහැදිලි වේ. ආයතනය මගින් 2005/06 මහ කන්නයේ රජයේ වී මිල දී ගැනීමේ වැඩ සටහන ඇගයීමට ලක් කල අතර එහි දී, එකී වැඩසටහනෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට අසමත්ව ඇති බව අනාවරණය විය. සෑම අධ්‍යයනයකම සොයා ගැනීම් පිළිබඳ සවිස්තර තොරතුරු එකී අංශයන්ගේ ක්‍රියාකාරකම් යටතේ ඉදිරිපත් කරනු ඇත.

සවිස්තරාත්මක පර්යේෂණ අතර රටේ පවතින සුවිශාලම කෘෂි ආශ්‍රිත කර්මාන්තයක් වන සහල් මෝල් කර්මාන්තය පිළිබඳ අධ්‍යයනය මගින් එකී කර්මාන්තයේ සංවර්ධනය අරමුණු කොටගත් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා දත්ත පදනමක් සපයනු ලබයි. මෙම අධ්‍යයනය මගින් රට තුළ පවතින සහල් මෝල් 1727 ක් ආවරණය කරන ලදී. අධ්‍යයනයට අනුව, දිනකට මෙ.ටො. 8 කට වඩා කෙටීමේ ධාරිතාවයක් ඇති මෝල් 187ක් පවතී. ඉන් 72%ක්ම ප්‍රධාන වී නිෂ්පාදන දිස්ත්‍රික්කයන් හි පිහිටා ඇත. ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කයන්ගේ පොළ අධ්‍යයනය සඳහා බස්නාහිර පළාත් සභාව මගින් මූල්‍යාධාර සපයා තිබේ. එම අධ්‍යයනය මගින් එකී දිස්ත්‍රික්ක දෙකෙහි එක් එක් පොළ සඳහා තොරතුරු පැතිකඩක් සපයනු ලබයි. එම අධ්‍යයනයේ එකී තොරතුරු පැතිකඩ මගින් ප්‍රමාණවත් නොවන සහ දුර්වල මට්ටමක පවතින යටිතල පහසුකම් පිළිබඳව අනාවරණය කරයි. යටිතල පහසුකම් දියුණු කිරීම සහ වඩා හොඳ කළමනාකරණ පද්ධතියක් වැඩිදියුණු කොට සංවර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමේ අවශ්‍යතාවය සහතික කරයි.

පර්යේෂණයට අමතර වශයෙන් ආයතනය මගින් 'ගම නැගුමට' 'සිතට සවිය' නමින් පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. කෘෂිකර්මය පදනම් කොටගත් ප්‍රජා ක්‍රියා සැලසුම් සකස් කිරීම පිළිබඳව පළාත් සභා ලේකම් කාර්යාලයන්හි නිලධාරීන් සතු දැනුම පුළුල් කිරීම මෙහි අරමුණයි. එමෙන්ම, කෘෂි සංවර්ධනයට සම්බන්ධ, පවතින සමාජ-ආර්ථික කරුණු සම්බන්ධයෙන් ප්‍රසිද්ධ දේශන පහක් පවත්වන ලදී.. නිති ප්‍රකාශයට පත් කෙරෙන ප්‍රකාශනයන් වන ශාස්ත්‍රීය සඟරා, පුවත් හසුන සහ ලුහුඬු වාර්තාවන්ට අමතරව 2007 වසරේ දී, පර්යේෂණ වාර්තා දහයක් ප්‍රකාශයට පත් කරන ලදී.

රට තුළ, ආහාර අලෙවි ක්‍රියාදාමය සංවර්ධනය කිරීම සඳහා ආහාර සහ කෘෂිකර්ම සංවිධානය වෙත ආයතනය විසින් ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කරන ලදී. බෙහෙවින් දිගු අලෙවි දාමයන් සහිත ඉදිරි හා පසු සම්බන්ධතාවයෙන් තොර වූ වර්තමාන අලෙවිකරණ ක්‍රියාවලියේ ප්‍රථිඵල වන්නේ අධික මිල උච්චාවචනය, ඉහළ ගනු දෙනු පිරිවැය, අධික පසු අස්වනු හානි හා අඩු ප්‍රමිතියකින් යුතු භාණ්ඩයන් සැපයීම වේ. යෝජිත ව්‍යාපෘතිය මගින් මෙම ගැටලුවලට විසඳුම් වශයෙන් ක්‍රමෝපායයන් හයක් ඉදිරිපත් කර ඇත. ඒ මෙසේය. i. රාජ්‍ය හා පෞද්ගලික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම. ii. දැනට පවතින අලෙවි තොරතුරු ක්‍රියාදාමය සංවර්ධනය කිරීම. iii. වෙළඳපොළ ප්‍රවේශයන් වැඩිදියුණු කිරීම. iv. වෙළඳපොළවල් නගා සිටුවීම v. අලෙවි සහ ගොවි සංවිධාන/සමාගම් වැනි ආයතන ශක්තිමත් කිරීම. vi. ගොවිතැන ව්‍යාපාරයක් වශයෙන් කරගෙන යාමට ගොවීන් තුළ ශක්තිය ගොඩනැගීම.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිළධාරීන් තිදෙනෙකුට, ජාත්‍යන්තර සම්මන්ත්‍රණ/වැඩමුළු වල දී පර්යේෂණ වාර්තා ඉදිරිපත් කිරීමට ඇරයුම් ලැබුණි. රට තුළ පවතින විවිධ විශ්ව විද්‍යාල මගින් පවත්වනු ලබන උපාධි සහ පශ්චාත් උපාධි පාඨමාලා සඳහා බාහිර කථිකාචාර්යවරුන්, බාහිර සුපරීක්ෂකවරුන් සහ පරීක්ෂකවරුන් වශයෙන් පර්යේෂණ නිලධාරීහු සේවය කළෝය.

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ආසියා-පැසිපික් කලාපීය (CIRDAP) මධ්‍යස්ථානය සමග ශ්‍රී ලංකාවේ සම්බන්ධක ආයතනය වශයෙන් අඛණ්ඩ සමීප සහයෝගී සම්බන්ධතාවයක් පවත්වා ගන්නා ලදී. දැනටමත් පර්යේෂණ නිළධාරී මහතෙකු ග්‍රාමීය සංවර්ධනය සඳහා ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීමේ අරමුණින් එම ආයතනය සමග ශ්‍රී ලංකාවේ අතීත ග්‍රාම සංවර්ධන මූලාශ්‍ර/මූලිකාංග විමසුමට බඳුන් කිරීමේ කාර්යයට සම්බන්ධ වී සිටියි.

ආහාර අනාරක්ෂිත බව සහ අවදානම සිතියම්ගත කිරීමේ වැඩ සටහනේ කේන්ද්‍රීය මධ්‍යස්ථානය (FIVIMS) වශයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය කටයුතු කරයි. මෙම ව්‍යාපෘතිය සඳහා ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් මූල්‍ය ප්‍රතිපාදන සැපයුණි. මෙම ආහාර අනාරක්ෂිත බව සහ අවදානම සිතියම්ගත කිරීමේ වැඩ සටහනේ අරමුණ වන්නේ ජාතික, පළාත්, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාමීය මට්ටමෙන් ආහාර අනාරක්ෂිත බව සහ අවදානම පිළිබඳ තොරතුරු සිතියම් ගත කිරීමේ ක්‍රමවේදයක්/ක්‍රියාවලියක් ස්ථාපනය කිරීමයි. මෙම ව්‍යාපෘතිය යටතේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පිහිටුවා ඇති FIVIMS ලේකම් කාර්යාලය මගින් ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ දැනුම ඉහළ නැංවීම සඳහා ජාතික මට්ටමේ සම්මන්ත්‍රණයක් සංවිධානය කළේය.

බාහිර පිරිස් වෙතින් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පවතින සම්මන්ත්‍රණ ශාලා පහසුකම් සහ නේවාසික පහසුකම් කෙරෙහි සුවිශාල ඉල්ලුමක් පවතී. වර්ධනය වන ඉල්ලුමට අවශ්‍ය පහසුකම් සැපයීම පිණිස විමසුමට බඳුන් කෙරෙන වසර තුළ දී පවතින ශ්‍රවණාගාරය, සම්මන්ත්‍රණ ශාලාව, දේශන ශාලා සහ කමිටු කාමර වලට අමතරව තවත් සම්මන්ත්‍රණ ශාලාවක් පද්ධතියට එක්විය. 2007 වසරේ මෙම පහසුකම් කුලී පදනම යටතේ ලබාදීමෙන් රුපියල් මිලියන 9.09 ක් උපයා ගන්නා ලදී. 2006 වසර සමග සැසඳීමේදී මෙම ප්‍රමාණය 63% ක වර්ධනයකි.

වී.කේ. නානායක්කාර
අධ්‍යක්ෂ
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

## පාලක මණ්ඩලය

| | | |
|---|---|---|
| ටී.එම්. අබයවික්‍රම මහතා | - | සභාපති, පාලක මණ්ඩලය සහ ලේකම්, කෘෂිකර්ම සංවර්ධන සහ ගොවිජන සේවා අමාත්‍යාංශය (2007 මාර්තු සිට) |
| තිස්ස වර්ණසූරිය මහතා | - | සභාපති, පාලක මණ්ඩලය සහ ලේකම්, කෘෂිකර්ම සංවර්ධන සහ ගොවිජන සේවා අමාත්‍යාංශය (2007 පෙබරවාරි දක්වා) |
| වී.කේ. නානායක්කාර මහතා | - | අධ්‍යක්ෂ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |
| ඩබ්.එම්. ජයතිලක මහතා | - | අතිරේක ලේකම්, කෘෂිකර්ම සංවර්ධන සහ ගොවිජන සේවා අමාත්‍යාංශය |
| එන්.කේ.ජී.කේ. නෙම්මාවත්ත මහතා | - | අධ්‍යක්ෂ, වෙළඳ, තීරුබදු සහ ආයෝජන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය |
| බිම්බා ගුණතිලක මහත්මිය | - | අධ්‍යක්ෂ, ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශය |
| කේ.ඩී.එස්. රුවන්චන්ද්‍ර මහතා | - | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| මාලිනී පීරිස් මහත්මිය | - | අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය |
| වසන්ත ඒකනායක මහතා | - | අතිරේක ලේකම්, (මහවැලි සහ අපනයන කෘෂිකර්මය) කෘෂිකර්ම සංවර්ධන සහ ගොවිජන සේවා අමාත්‍යාංශය (2007 සැප්තැම්බර් සිට) |
| සෑම් එදිරිසූරිය මහතා | - | අතිරේක ලේකම් වෙළඳ වාණිජ සහ ගොවිජන සේවා අමාත්‍යාංශය |
| කේ.එල්. ද සිල්වා මහතා | - | ජ්‍යෙෂ්ඨ ආර්ථ ශාස්ත්‍රඥ සහ ප්‍රධාන, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව |
| මහාචාර්ය බුද්ධි මාරඹේ | - | පීඨාධිපති, කෘෂිකර්ම පීඨය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| ආචාර්ය සී. කුඩාගමගේ | - | කෘෂිකර්ම අධ්‍යක්ෂ ජෙනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |

| | | |
|---|---|---|
| එස්.ඩී.ඒ.බී. බොරලැස්ස මහතා | - | ඉඩම් කොමසාරිස් ජෙනරාල්, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව |
| ඩී.ඩී. වනිගනායක මහතා | - | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජෙනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |
| බී.එම්.එස්. සමරසේකර මහතා | - | වාරිමාර්ග අධ්‍යක්ෂ ජෙනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව |
| ඒ.පී.ජී. කිත්සිරි මහතා | - | සමුපකාර සංවර්ධන කොමසාරිස් ජෙනරාල් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (2007 සැප්තැම්බර් සිට) |
| පෝටේ චුම්ශ්‍රී මහතා | - | නේවාසික නියෝජිත, ආහාර හා කෘෂිකර්ම සංවිධානය |
| සී.පී. සිරිවර්ධන මහතා | - | ලේකම්, ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය (2007 ජනවාරි සිට අගෝස්තු දක්වා) |
| එම්. වීරසිංහ මහතා | - | අතිරේක ලේකම් (සංවර්ධන) මහවැලි සහ ගංගාද්‍රෝණිය සංවර්ධන අමාත්‍යාංශය (2007 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා) |
| ආර්.ද සිල්වා මහත්මිය | - | ලේකම්, පාලක මණ්ඩලය සහ ලේඛකාධිකාරිණී, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය |

# කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම් අංශය

**අවසන් කළ අධ්‍යයන**

1. **බලය විමධ්‍යගත කිරීම ශ්‍රී ලංකාවේ දේශීය කෘෂිකාර්මික අංශයට බලපාන ආකාරය පිළිබඳ අධ්‍යයනය**

**පර්යේෂණ කණ්ඩායම:**

| | | |
|---|---|---|
| එම්.කේ.එන්. දමයන්ති මෙනෙවිය | - | සම්බන්ධීකාරක/පර්යේෂණ නිලධාරිණී |
| වී.කේ. නානායක්කාර | - | අධ්‍යක්ෂ |

මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණ වන්නේ දේශීය ආහාර බෝග නිෂ්පාදන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පළාත් සභාවන්හි කාර්ය සාධන ප්‍රගතිය තක්සේරු කිරීමයි.

එහි සුවිශේෂ අරමුණු වන්නේ:

i. රජය සහ පළාත් සභා අතර ක්‍රියාකාරීත්වය/විෂයයන්/ආයතනවල අනුකූලතාව විමර්ශනය කිරීම;
ii පළාත් සභාවල වගකීම් සහ කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනය කිරීම;
iii. ඉඩම්, වාරිමාර්ග, යටිතල පහසුකම්, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ව්‍යාප්ති සේවයට සම්බන්ධිත ගැටලු විසඳීමේ දී පළාත් සභාවල සඵලතාව පිළිබඳ ඇගයීම;
iv. පළාත් සභාවල කාර්ය සාධනය සඳහා බලපෑම් කරනු ලබන සාධක අධ්‍යයනය. (උදා: විමධ්‍යගත කළ මානව සම්පත් ඇතුළත් ව සම්පත් පිළිබඳ දුෂ්කරතා);
v. පළාත් සභාවල කටයුතු වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපත්තිමය යෝජනා ඉදිරිපත් කිරීම.

මෙම අධ්‍යයනය දකුණ, ඌව සහ වයඹ පළාත් පාදක කොටගෙන සිදු කරන ලදී. අධ්‍යයනය සඳහා ප්‍රාථමික සහ ද්විතියික දත්ත රැස් කරන ලදී. අධ්‍යයනය සඳහා තොරතුරු ලබාගැනීමේ අරමුණින් සංවිධානය කරනු ලැබූ කෘෂිකර්ම, වාරිමාර්ග සහ ඉඩම් සම්බන්ධ විද්වත් වැඩමුළුවලින් ලබා ගත් තොරතුරු ද අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී.

**අධ්‍යයනයේ මූලික සොයාගැනීම්:**

i. ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වැනි සංශෝධනය යටතේ කෘෂිකර්ම සහ ගොවිජන සේවා, සත්ත්ව පාලනය, ඉඩම් සහ වාරිමාර්ග (අන්තර් පළාත් ඉඩම් සංවර්ධන මෙන්ම වාරි යෝජනා ක්‍රම හැර) විෂයයන් පළාත් සභා වෙත විමධ්‍යගත කර ඇත. මෙය වඩාත් අර්ථාන්විත වීම සඳහා රජයේ විවිධ මට්ටම්වල භූමිකාව පැහැදිළිව අර්ථ නිරූපනය කළ යුතු වේ. එහෙත් ව්‍යවස්ථාමය සකස් කිරීම්, ව්‍යවස්ථාදායකය විසින් පැන වූ අණ පනත් හෝ පරිපාලන චක්‍රලේඛ තුළින් අතිපිහිත (over lapping) වන ක්ෂේත්‍ර හෝ අර්ථ නිරූපණ වර්තමානයේ පවතී.
ii. ප්‍රජාතන්ත්‍රවාදී විමධ්‍යගතකරණ ක්‍රමයට පළාත් සභා නොකැමැත්තෙන් අනුගත වී ඇති බව පෙනේ. පළාත් සභා විසින් ඉහළ මට්ටමේ ස්වාධීනත්වයක් සඳහා කරන බලපෑම් උත්සන්න වන අතරම එයට ප්‍රතිවිරුද්ධ දිශාගත ව ප්‍රාදේශීය මට්ටමේ නිර්ණායකයන්ට හේතු පාදක වන බලය පළාත් මට්ටමේම රඳවා තබා ගැනීමට හෝ මධ්‍යගත කර ගැනීමට උත්සාහ දරනු ලබයි.
iii. කෘෂිකර්ම හා ගොවිජන සේවා විමධ්‍යගත විෂයයන් වුව ද, වගකීම් ඉටු කිරීම සඳහා පළාත් සභාවන්ට හිමි ව ඇත්තේ සාපේක්ෂව කුඩා කාර්ය මණ්ඩලයකි. පළාත් සභා නවයෙහි ම කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිකයන්ගේ එකතුව රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාවට වඩා අඩු ය.

iv. අන්තර් වාරි ව්‍යාපාරයන්හි හැර, කෘෂි ව්‍යාප්ති සේවාව පළාත් සභා විෂයයකි. එසේ වුවද, ග්‍රාමීය මට්ටමේ ව්‍යාප්ති සේවක පිරිසක් පළාත් සභා සතුව නොමැත.

v 1987 දී කෘෂි ව්‍යාප්තියට අදාළ වගකීම් පළාත් සභා වෙත පැවරීමේ ප්‍රතිඵලයක් වශයෙන් පර්යේෂණ හා ව්‍යාප්ති අතර සම්බන්ධතාව ඇණහිට ඇති බව විද්‍යාමාන වේ.

vi. පළාත් සභා ස්ථාපිත කිරීමේ දී යේවා සංස්කරණ අභ්‍යාස ආයතන තුනක් පළාත් සභා වෙත භාරදෙනු ලැබිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, පුහුණු ක්ෂේත්‍රයේ ගැටලු ගණනාවක් ඉස්මතු වී ඇත. එම ගැටලු පහත සඳහන් ආකාර වේ.

- ව්‍යාප්ති සේවාවේ කාර්ය මණ්ඩලයට පුහුණු අවස්ථා හිගවීම.
- පුහුණු මධ්‍යස්ථානවල ධාරිතාව නිසි අයුරින් භාවිතයට නො ගැනීම.
- මධ්‍යස්ථාන නිසි පරිදි නඩත්තු නො කිරීම.
- පළාත් සභා අතර ප්‍රාදේශීය අසමතුලිතතාවන් නිර්මාණය කිරීම.

## 2 ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම කෘෂිකාර්මික ක්ෂේත්‍රයට බලපාන ආකාරය පිළිබඳ වැඩමුළුව

**සම්බන්ධීකරණ කණ්ඩායම:**

එම්.කේ.එන්. දමයන්ති මෙනෙවිය - සම්බන්ධීකාරක/පර්යේෂණ නිලධාරිණී
එම්.ඩී. සුසිලා ලුරදු මිය - පර්යේෂණ නිලධාරිණී

**වැඩමුළුවේ අරමුණු:**

i. කෘෂිකාර්මික සංවර්ධනයේ දී පළාත් සභා ක්‍රමය විසින් ඉටු කරන කාර්යභාරය පිළිබඳ තොරතුරු සහ දැනුම සම්බන්ධව පවතින හිඩැස සම්පූර්ණ කිරීම

ii. පළාත් මට්ටමේ කෘෂිකාර්මික සංවර්ධන කටයුතු ඉටු කරන්නන් ගේ අත්දැකීම් සහ අදහස් හුවමාරු කරගැනීම සඳහා ඉඩ ප්‍රස්ථාව සැලසීම.

iii. ගම් මට්ටම දක්වා බලය විමධ්‍යගත කිරීම පිළිබඳ දැනට සිදු කෙරෙන සාකච්ඡාවන්හි දී පවතින විමධ්‍යගතකරණයෙන් ලැබිය හැකි අත්දැකීම් උපයෝගී කරගැනීමට අවස්ථාවක් සැලසීම.

iv. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ඵලදායක වන්නා වූ වාර්තාවක් සැකසීම.

v. දැනට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් සිදු කෙරෙන "ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීම. කෘෂිකාර්මික අංශය කෙරෙහි සිදු කර ඇති බලපෑම" පිළිබඳ අධ්‍යයනය සඳහා තවදුරටත් තොරතුරු රැස්කර ගැනීම.

2007 ජනවාරි - පෙබරවාරි කාලය තුළ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී විද්වත් වැඩමුළු තුනක් පවත්වන ලදී. මෙම වැඩමුළු සඳහා විවිධ පළාත් සභාවල පළාත් කෘෂිකර්ම, ඉඩම් සහ ඉඩම් සංවර්ධන, වාරිමාර්ග සහ සත්ත්ව නිෂ්පාදන අමාත්‍යාංශ ලේකම්වරුන්, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය පිළිබඳ පළාත් අධ්‍යක්ෂවරුන්, පළාත් ඉඩම් කොමසාරිස්වරුන් ඇතුළු ප්‍රධාන නිලධාරීන් පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. මෙම විද්වත් වැඩමුළු තුනෙහිම වාර්තා පහත සඳහන් මාතෘකා යටතේ මුද්‍රණය කර ඇත.

i. පළාත් සභා ක්‍රමය සහ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ විද්වත් වැඩමුළුවේ වාර්තාව
(සිංහල මාධ්‍ය/2007 අප්‍රේල්)

ii පළාත් සභා ක්‍රමය තුළ ඉඩම් විෂයයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විද්වත් වැඩමුළු වාර්තාව
(සිංහල මාධ්‍ය/2007 මැයි)

iii පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග විෂයයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විද්වත් වැඩමුළු වාර්තාව.
(සිංහල මාධ්‍ය /2007 නොවැම්බර්)

## 3. ශ්‍රී ලංකාවේ ආහාර භෝග අංශයේ ශ්‍රම වෙළඳපොළ තුළ මෑත කාලීන නැඹුරුවීම් පිළිබඳ අධ්‍යයනය

| | | |
|---|---|---|
| **පර්යේෂණ කණ්ඩායම** | : | ආචාර්ය පී.එම්. හේනෙගෙදර - අධි පර්යේෂක |
| **දත්ත විශ්ලේෂණය** | : | එන්.එන්. ආනන්ද සිල්වා මහතා - ජ්‍යෙෂ්ඨ සංඛ්‍යාන නිලධාරී |
| **අධ්‍යයන ප්‍රදේශ** | : | හිඟුරක්ගොඩ, රඹුක්කන, පල්ලෙපොල, වැලිමඩ, උඩුදුම්බර සහ ගලෙන්බිඳුණු වැව |
| **මූල්‍ය අනුග්‍රාහක ආයතනය/** | : | කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (CARP) |

අධ්‍යයනය සම්පූර්ණ කොට කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව (CARP) වෙත භාර දෙන ලදී.

අධ්‍යයනයේ සොයා ගැනීම් මූලිකවම ශ්‍රමිකයින් යොදා ගැනීමේ රටාව වෙනස් වීම, වී මූලික වූ ආහාර භෝග නිෂ්පාදනයේ නිෂ්පාදන වියදම වෙනස්වීම කෙරෙහි බලපෑම පිළිබඳව විය. ඒ අනුව, කම්කරු ශ්‍රමය අඩු කිරීමේ ක්‍රම මගින් ගොවිතැන යාන්ත්‍රිකරණය වී ඇති බව සඳහන් කරමින් වතු වගා නොවන කෘෂිකර්මයට ඇති සේවක කැමැත්ත අඩු වී ඇත. ග්‍රාමීය ප්‍රදේශ වලින් නාගරික ප්‍රදේශවලට සහ කර්මාන්ත සහ සේවා අංශයන්ට එකතු වීමට කෘෂිකර්මාන්තයෙන් සේවක ඉවත් වීම් හේතු වී ඇත. සේවක ඉල්ලුම, පලපුරුද්ද, ස්ත්‍රී පුරුෂ භාවය, වගා කිරීම පිළිබඳ අවබෝධය, කාර්යක්ෂමතාව, අවංක බව සහ වයස වැනි විශේෂ සාධක මත නිශ්චය වේ. නමුත් සේවක සැපයුම පවුලේ පවතින ප්‍රමාණය සහ සේවක භුවමාරුව මත රඳා පවතියි. එබැවින්, වැටුප් ප්‍රමාණ ඉහත ගුණාංග මත තීන්දු වන අතර එමනිසා අදක්ෂ සේවකයින්ට වඩා ඉහළ වැටුප් ප්‍රමාණ දක්ෂ සේවකයින් ලබයි. වැසි ජලයෙන් වගා කරනු ලබන වී, එළවළු සහ මෙනේරි වැවෙන ප්‍රදේශවලට වඩා වාරිමාර්ග මගින් ජලය සපයා වගා කරන වී, එළවළු සහ ඉරිඟු වැවෙන ප්‍රදේශවල සේවක ඵලදායිතාව ඉහළ වේ. මෙය, ඉහළ ඵලදායිතාව සහ කම්කරු සේවය අඩු කිරීමේ ක්‍රමෝපායයන් යන කරුණු හේතුවෙනි.

ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන් විසින් සැලකිල්ලට ගත යුතු මූලික කරුණු ලෙස කරුණු 6ක් හඳුනාගන්නා ලදී. මෙම නිරීක්ෂණය තුළ, වී වගා කිරීමෙන් සේවක ඉවත් වීම, සේවකයින් සැපයීමේ රටාව වෙනස් වීම, නව තාක්ෂණය සහ යන්ත්‍රෝපකරණ භාවිතයට නැඹුරුව, ගොවිතැන හා සම්බන්ධ සංස්කෘතික සහ වටිනාකම් ක්‍රමය වෙනස් කිරීම සහ සේවක ප්‍රමාණය වැඩි කිරීම වඩාත්ම වැදගත් සාධක වේ. අවසානයේ දී, ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් විශාල හා ක්ෂුද්‍ර ප්‍රතිපත්තිමය දර්ශනයන්ගෙන් සැලකිල්ලට ගත යුතු ප්‍රතිපත්ති උපදෙස් කිහිපයක් අධ්‍යයනය යෝජනා කරයි. පුහුණු කිරීම, ශක්‍යතා වර්ධනය සහ සේවා සභාය ජයග්‍රාහී තත්ත්වයකට ළඟා වීම සඳහා නිර්දේශිත වඩා වැදගත් වන ප්‍රතිපත්තිමය කරුණු වේ.

## 4. ඌව වෙල්ලස්සේ යෝජිත උක් සංවර්ධන ව්‍යාපෘතිය සඳහා පූර්ව-ශක්‍යතා අධ්‍යයනය

**පර්යේෂණ කණ්ඩායම:**

| | | |
|---|---|---|
| ආචාර්ය එල්.පී. රූපසේන මහතා | - | අධි පර්යේෂක |
| ආචාර්ය ටී.ජී. ධර්මරත්න මහතා | - | අධි පර්යේෂක |
| ආර්.එම්.පී.කේ.බී. රත්නායක මහතා | - | සහාය අධි පර්යේෂක |
| ආචාර්ය ඩබ්ලිව්.පී. ජයසේන මහතා | - | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) |

**මූල්‍ය සම්පාදනය:** උක් පර්යේෂණ ආයතනය

යෝජිත උක් සංවර්ධන ව්‍යාපෘතියෙහි පූර්ව - ශක්‍යතාවය විමසා බැලීම කෙරෙහි යොමු වූ මෙම අධ්‍යයනය උක් පර්යේෂණ ආයතනයෙහි ඉල්ලීම පරිදි 2007 මාර්තු මාසයේ දී ආරම්භ කරනු ලැබිණි.

**අධ්‍යයනයෙහි අරමුණු:**

i. ව්‍යාපෘති ප්‍රදේශයෙහි ජනතාවගේ ජන විකාශන ලක්ෂණ, අධ්‍යාපන මට්ටම් හා රැකියාවන්හි ස්වාභාවය අධ්‍යයනය කිරීම.

ii. ඉඩම් අයිතියෙහි ස්වභාවය හා බෝග රටාව සොයා බැලීම.

iii. අනෙකුත් තරගකාරී බෝග සමග සංසන්දනය කිරීමේදී උක් සඳහා ඇති තරගකාරී ලාභදායීත්වය ගණනය කිරීම.

iv යෝජිත ව්‍යාපෘති ප්‍රදේශය තුළ ඇති යටිතල පහසුකම් පිළිබඳව විමසා බැලීම.

v. උක් වගාව සඳහා සුදුසු බිම් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම.

අධ්‍යයනය සම්පූර්ණ කරනු ලැබූ අතර එහි කෙටුම්පත් වාර්තාවෙහි පිටපතක් උක් පර්යේෂණ ආයතනය වෙත භාර දෙනු ලැබිණ. අධ්‍යයනයෙහි සොයාගැනීම් අතිරේක වැවිලි භෝග සංවර්ධන අමාත්‍යාංශය වෙත ද ඉදිරිපත් කරනු ලැබිණි. අධ්‍යයනයෙහි සොයා ගැනීම් පහත සඳහන් පරිදි වේ.

i. ව්‍යාපෘති ප්‍රදේශයෙහි ජීවත්වන පවුල් වලින් 50% ක් පමණ දුප්පත්කමේ සීමාවෙන් පහළ මට්ටමෙහි පසු වේ.

ii. අදාළ ප්‍රදේශයේ රැකියා වියුක්තිකයන්ගේ සංඛ්‍යාව ලක්ෂයකට අධික ය. ඔවුන්ගෙන් වැඩි ප්‍රමාණයක් තරුණයින්ය.

iii. උස් බිම්වල වගා කරනු ලබන ප්‍රධාන බෝග වන්නේ බඩ ඉරිඟු, කෙසෙල්, මුංඇට, කව්පි සහ රටකජු ය. නියඟයට ඔරොත්තු දීම, සහතික කරන ලද වෙළඳපොළක් පැවතීම හා අමතර රැකියාවන්හි යෙදීම සඳහා අවකාශ තිබීම යනා දී කරුණු මත ගොවීහු උක් වගාව සඳහා වැඩි කැමැත්ත දක්වති.

iv. උක් වගාව සඳහා භාවිතා කළ හැකි සුදුසු ඉඩම් අක්කර 70,000 පමණ ඇති බව අනාවරණය විය.

v. යටිතල පහසුකම් විමසා බැලීමේ දී ප්‍රදේශයේ පාරවල් වැඩි දියුණු කළ යුතු බව පෙනී ගියේය.

අධ්‍යයනයෙහි නිගමනය වූයේ උක් වගාව සඳහා අවශ්‍ය සුදුසු ඉඩම් මෙන්ම අවශ්‍ය ශ්‍රමය යෝජිත ව්‍යාපෘති ප්‍රදේශය තුළින් සපයා ගත හැකි බවයි.

**දැනට ක්‍රියාත්මක අධ්‍යයන**

1. ශ්‍රී ලංකාවේ ගොවි ජනපද ව්‍යාපාරයන්හි පවත්නා අවිධිමත් ඉඩම් ගනුදෙනු ක්‍රම, එහි නිෂ්පාදනය සහ ජානපදිකයින්ගේ ආයෝජන සහ ආදායම් කෙරෙහි කරනු ලබන බලපෑම.
2. ශ්‍රී ලංකාවේ සුළු ගොවි අංශයෙහි කෘෂිකාර්මික හා ගොවිජන ක්ෂේත්‍රයන්හි පරිවර්තන : පවතින තත්ත්වය හා මතුවන ප්‍රවණතා පිළිබඳ ප්‍රත්‍යක්ෂ මූලික අධ්‍යයනය
3. කිරි ගම්මාන සංවර්ධන ව්‍යාපෘතියේ මධ්‍ය කාලීන ඇගයීම
4. ග්‍රාමීය මට්ටමින් ව්‍යාප්ති සේවය සැපයීමේ දී කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර වෙත පවතින සීමාවන් සහ විභවතාවන් පිළිබඳ අධ්‍යයනය
5. ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මව්වාගම ග්‍රාමයේ 'ගම නැගුම' වැඩසටහන යටතේ ක්‍රියාත්මක ක්‍රියාබද්ධ පර්යේෂණය.
6. ශ්‍රී ලංකාවේ කුඩා ඉඩම් අංශයේ තත්ත්වය පිළිබඳ ඇගයීමක්
7. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ආසියා සහ පැසිපික් කලාපීය මධ්‍යස්ථානයට අයත් (CIRDAP) සාමාජික රටවල ග්‍රාමීය සංවර්ධන ක්‍රියාකාරකම් සහ ප්‍රතිඵල ඇගයීම. එම කලාපීය මධ්‍යස්ථානයේ අනාගත අවස්ථා

**පර්යේෂක : ආචාර්ය ධනවර්ධන ගමගේ, අධි පර්යේෂක**

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ආසියා සහ පැසිපික් කලාපීය මධ්‍යස්ථානය සඳහා ශ්‍රී ලංකාවේ පසුගිය සහ වර්තමාන ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්, පවතින තත්ත්වය සහ රජයේ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන්වල

කාර්ය සාධනය පිළිබඳ ඇගයීම ආචාර්ය ධනවර්ධන ගමගේට පවරා ඇත. ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ආසියා සහ පැසිපික් කලාපීය මධ්‍යස්ථානයෙහි අරමුණ වන්නේ, ග්‍රාමීය සංවර්ධනයෙහි උපාය මාර්ග, විශේෂයෙන්ම වෙනස්වන සන්දර්භය තුළ සාමාජික රටවල ග්‍රාමීය සංවර්ධන ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය ඉදිරි කාලය සඳහා ඉලක්ක ගත කිරීමට මැදිහත් වීමයි. ඒ.ග්‍රා.ස.ආ.පැ. කලාපීය මධ්‍යස්ථානය විසින් 2007.11.12 දින ඩකාහි දී පැවැත් වූ රැස්වීමට ආචාර්ය ගමගේ සහභාගීවීමෙන් පසුව මෙම වාර්තාවෙහි වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

## කෘෂිකාර්මික හා පාරිසරික සම්පත් කළමනාකරණ අංශය

### දැනට ක්‍රියාත්මක අධ්‍යයන

1. සබරගමුව පළාත තුළ කිතුල් කර්මාන්තයෙහි වර්තමාන තත්ත්වය සහ අනාගත හැකියාවන් පිළිබඳ අධ්‍යයනය.
2. උඩරට එළවළු වගා පද්ධතිය තුළ සංරක්ෂණ ගොවිතැන් ක්‍රම විසරණය පිළිබඳ අධ්‍යයනය
3. ප්‍රාදේශීය විශේෂිත වූ කෘෂිපාදක කර්මාන්ත හඳුනා ගැනීම පිළිබඳ අධ්‍යයනය-හම්බන්තොට දිස්ත්‍රික්කය
4. උඩවලව වනෝද්‍යානයෙන් ගවයින් ඉවත් කිරීම සහ රුහුණේ කිරිගව ගැටලුව පිළිබඳ අධ්‍යයනය (පියවර 3 සහ 4)
5. සුළු ගොවීන් වෙත ලබා දෙන නව පොහොර සහනාධාරය ඇගයීමට ලක් කිරීමේ අධ්‍යයනය.

## වාරි ජල කළමනාකරණය සහ ගොවිජන සම්බන්ධතා අංශය

### අවසන් කළ අධ්‍යයන:

1. **ශ්‍රී ලංකාවේ ජල සම්පත හා ප්‍රශස්ථ ජල භාවිතය පිළිබඳ අත්පොත සම්පාදනය කිරීම.**

| | | |
|---|---|---|
| **පර්යේෂණ කණ්ඩායම:** | ආචාර්ය ඩබ්.එම්.ජී.බී. ගිරාගම | - සම්බන්ධීකාරක/අංශ ප්‍රධාන වාරි ජල කළමනාකරණ හා ගොවිජන සම්බන්ධතා අංශය |
| | එස්.එම්.ඒ. සමරකෝන් මහතා | - ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| | එච්.එම්.ජේ.කේ. හේරත් මහතා | - පර්යේෂණ නිලධාරී |
| | එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා | - පර්යේෂණ නිලධාරී |
| | පී.පී.ද එල්.ඩබ්. සමරසිංහ මිය | - පර්යේෂණ නිලධාරී |
| | ප්‍රභාත් විතාරණ මහතා | - ඉංජිනේරු, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව |

පරිච්ඡේද හතකින් සමන්විත මෙම අත්පොතේ අවසාන කෙටුම්පත සකසා අවසන් කර ඇත. එම පරිච්ඡේද නම්;

1. හැඳින්වීම (දේශගුණය, වර්ෂාපතන වෙනස්වීම, වාෂ්පීකරණය, උෂ්ණත්වය සහ ප්‍රවණතා, කෘෂි පාරිසරික කලාප).
2. පැරණි වාරිමාර්ග තාක්ෂණය සහ ජලාශ ප්‍රතිසංස්කරණය.
3. ජල සම්පත් (මතුපිට/භූගත).
4. ජල සම්පාදන ක්‍රම (ගුරුත්ව ජල සම්පාදනය සහ විකල්ප ජල සම්පාදන ක්‍රම, වැසිදිය ප්‍රයෝජනයට ගැනීම.

5. ජල කළමනාකරණයේ දී ජල භාවිතා කරන්නන්ගේ සමාගම්/ගොවි සංවිධානවල කාර්යභාරය.
6. කෘෂිකර්මය සඳහා උපරිම ජල භාවිතය.
7. චීනය, ඉන්දියාව, ඉරානය සහ අනෙකුත් රටවල ජලය භාවිතා කරන ක්‍රම.

**දැනට ක්‍රියාත්මක අධ්‍යයන**

1. විවිධ අංශවල අවශ්‍යතා සඳහා ජලය වෙන්කර ගැනීම පිළිබඳ අධ්‍යයනය.
2. ශ්‍රී ලංකාවේ කුඩා අමුණු පද්ධති පිළිබඳ අධ්‍යයනය.
3. මතුපිට ආපදා වැසිදිය පොකුණු මගින් ශ්‍රී ලංකාවේ කෘෂි කර්මාන්තය කෙරෙහි ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යයනය.

## අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය

ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක ජීවන වියදම් විමර්ශන කමිටුවට වෙළඳපොළ තොරතුරු සපයාදීම පිණිස 1979 වසරේ දී ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය (ARTI) තුළ අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශය (MFPAD) පිහිටුවන ලදී. එතැන් සිට මෙම අංශය මගින් ප්‍රතිපත්ති සම්පාදකයින්, ව්‍යවසායකයන්, වෙළඳුන්, ගොවීන් සහ ශිෂ්‍යයන්ට අදාළ දත්ත සහ තොරතුරු සපයා දෙනු ලබයි.

ඉහත සඳහන් කරුණු වලට අමතරව, ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පිහිටුවා ඇති ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීම සහ ආවේක්ෂණ කමිටුවට මෙම අංශය මගින් රජයේ ආයතන වලට (ගුවන් හමුදාව/යුධ හමුදාව/නාවික හමුදාව යන රෝහල් සහ බන්ධනාගාරය) ආහාර ද්‍රව්‍ය මිල දී ගැනීම සඳහා අවශ්‍ය මිල තොරතුරු ලබා දෙයි.

**නිත්‍ය වැඩසටහන**
**ආහාර තොරතුරු හා වෙළඳපොළ දැනුවත් කිරීම පිළිබඳ ව්‍යාපෘතිය**

**පර්යේෂණ කණ්ඩායම:**

| | | |
|---|---|---|
| සී.පී. හතුරුසිංහ මහත්මිය | - | සම්බන්ධීකාරක/අංශ ප්‍රධාන |

**සම පර්යේෂණ නිලධාරීන්:**

| | | |
|---|---|---|
| ආචාර්ය ටී.ඒ. ධර්මරත්න මහතා | - | අධි පර්යේෂක |
| රෝෂිනී රඹුක්වැල්ල මහත්මිය | - | පර්යේෂණ නිලධාරිණී |
| රුචිනි විදානපතිරණ මහත්මිය | - | පර්යේෂණ නිලධාරිණී |

**සහාය:**

| | | |
|---|---|---|
| සංඛ්‍යාන නිලධාරීන්/සහකාරවරුන් | - | 14 |
| අනියම් විමර්ශකයින් | - | 18 |

අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය විසින්, ප්‍රතිපත්ති තීරණයන්ට අවශ්‍ය නිවැරදි දත්ත හා තොරතුරු නිසි වේලාවට සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබයි. තෝරාගත් ආහාර ද්‍රව්‍ය සඳහා වන අලෙවිකරණ තොරතුරු කොළඹ සහ ඒ අවට සිල්ලර වෙළඳපොළවල් නවයක් ආශ්‍රයෙන් එක්රැස් කරනු ලබන අතර පිටකොටුව, තොටලඟ, දෙමටගොඩ, බොරැල්ල, වැල්ලවත්ත, කිරුළපන, නුගේගොඩ, කඩවත සහ කිරිබත්ගොඩ යන සිල්ලර වෙළඳපොළවල් සහ පිටකොටුව (කොළඹ) තොග වෙළඳපොළ මෙයට අයත් ය. ඊට අමතරව, ප්‍රධාන නිෂ්පාදන දිස්ත්‍රික්ක සහ ප්‍රධාන ආහාර පරිභෝජනය කරන දිස්ත්‍රික්ක වශයෙන් හඳුනාගන්නා

ලද දිස්ත්‍රික්කවල වෙළඳපොළවල් 24 ආශ්‍රයෙන් ද දත්ත හා තොරතුරු එක් රැස් කරනු ලබයි. දත්ත රැස්කිරීම, සංඛ්‍යාන නිලධාරීන් 06 දෙනෙකුගෙන් සහ සංඛ්‍යාන සහකාරවරුන් 07 දෙනෙකුගෙන් ද, අනියම් විමර්ශකයන් 20 දෙනෙකු මගින් ද සිදු කෙරේ. ඈත පළාත්වල දත්ත එක් රැස් කිරීම සඳහා සංඛ්‍යාන සහකාරවරුන් සහ අනියම් විමර්ශකයන් 15 දෙනෙකු භාවිතා කෙරේ.

2007 වර්ෂයේ දී කුරුණෑගල, නිකවැරටිය, දඹුල්ල, මාතලේ, අනුරාධපුර, තඹුත්තේගම, පොළොන්නරුව, නුවරඑළිය, මහනුවර, හඟුරන්කෙත, බදුල්ල, කැප්පෙටිපොළ, රත්නපුර, ඇඹිලිපිටිය, හම්බන්තොට, තිස්සමහාරාමය, මාතර, ගාල්ල, කළුතර මොණරාගල, දෙහිඅත්තකණ්ඩිය, අම්පාර, පුත්තලම සහ මරදගහමුල යන ප්‍රදේශ ආවරණය කරමින් දත්ත හා තොරතුරු ලබාගන්නා ලදී.

මෙයට අමතරව, ආහාර ද්‍රව්‍යවල තොග මිල ගණන් දිනපතා පිටකොටුව, මහනුවර, දඹුල්ල, නොරොච්චෝල, මරදගහමුල සහ මීගොඩ යන වෙළඳපළවලින් එක් රැස් කෙරේ. මෙම දත්ත දිනපතා විද්‍යුත් මාධ්‍ය හරහා ප්‍රකාශයට පත් කෙරෙන අතර මේ තුළින් නිෂ්පාදකයන්ට හා වෙළඳුන්ට ප්‍රධාන තොග වෙළඳපළවල භාණ්ඩවල මිල ගණන් පිළිබඳව කල් වේලා ඇතිව අවබෝධයක් ලබාගත හැකිය. කොළඹ සහ පිට පළාත්වල ආහාර ද්‍රව්‍ය සඳහා පවතින තොග සහ සිල්ලර මිල ගණන් සහ ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල නිෂ්පාදන මිල ගණන් විශ්ලේෂණය කොට ඉදිරිපත් කරන සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව සතියේ සෑම සිකුරාදා දිනකම නිතුත් කරනු ලබයි.

### 2007 වර්ෂයේ ප්‍රගතිය

- සතිපතා ආහාර ද්‍රව්‍ය විවරණිකාව - විවරණිකා 52 ක් නිකුත් කොට ඇත.
- අදාළ ආයතන හා නිලධාරීන් වෙත දිනපතා ආහාර ද්‍රව්‍ය මිල ගණන් සැපයීම - වර්ෂය පුරාම
- දිනපතා සහ සතිපතා තොරතුරු මාධ්‍ය වෙත වාර්තා කිරීම
- ආහාර ද්‍රව්‍ය මිල ගණන් සහ අනෙකුත් වෙළඳපළ තොරතුරු වසර පුරාම රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ආයතන වෙත ඔවුන්ගේ ඉල්ලීම්වලට අනුව සැපයීම.

### අවසන් කළ අධ්‍යයන

**1. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රක්ෂණ සැලසුම ඇගයීම**

**පර්යේෂණ කණ්ඩායම:**

රෝෂිණී රඹුක්වැල්ල මහත්මිය - සම්බන්ධීකාරක

**සම පර්යේෂක:**

ටී.ජී. සෝමරත්න මහතා - පර්යේෂණ නිලධාරී
රුචිනි විදානපතිරණ මහත්මිය - පර්යේෂණ නිලධාරිණී

**අනුමත ඇස්තමේන්තුව :** රු. 481,240.00
**මූල්‍ය දායකත්වය :** CARP විසිනි

**අරමුණු**

මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ කෘෂිකාර්මික හා ගොවි කටයුතු රක්ෂණ මණ්ඩලය මගින් අරඹන ලද වගා (වී) රක්ෂණ සැලැස්ම ඇගයීමට ලක් කිරීමයි. අනෙක් අරමුණු පහත සඳහන් පරිදි වේ.

i. කෘෂිකාර්මික හා ගොවි කටයුතු රක්ෂණ මණ්ඩලය මගින් අරඹා ඇති වර්තමාන වගා රක්ෂණ සැලසුම් වල ඇති ගැටලු සහ සීමාවන් පිළිබඳ අධ්‍යයනය කිරීම.
ii කෘෂිකාර්මික හා ගොවි කටයුතු රක්ෂණ මණ්ඩලයේ සංවිධානාත්මක සැලැස්ම සහ වර්තමාන ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීම.

iii වගා රක්ෂණ සැලසුම පිළිබඳ ගොවීන්ගේ ඇති අවධානය සහ ඒ පිළිබඳ උනන්දුව අධ්‍යයනය කිරීම
iv වගා රක්ෂණ සැලසුම යටතේ ඉඩම් රක්ෂණය කළ ගොවියන් හඳුනා ගැනීම සහ ඒ සඳහා හේතු
v රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ කෘෂිකාර්මික රක්ෂණ සැලසුම් වල වෙනස්කම් සහ සමානකම් විස්තර කිරීම සහ
vi ඒ සඳහා දැනට පවතින වගා රක්ෂණ සැලසුම වැඩි දියුණු කිරීමට ක්‍රියාමාර්ග යෝජනා කිරීම.

මෙම අධ්‍යයනය සම්පූර්ණ කරන ලද අතර පර්යේෂණ වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී.

**සොයා ගැනීම්:**

නිෂ්පාදන වියදම හෝ වගාව විනාශ වීමේ ප්‍රමාණය සහ වන්දි මුදල් ගෙවීමේ ප්‍රමාදය හා සසඳා බලන කල ප්‍රමාණවත් නොවන වන්දි මුදල් හේතුවෙන් බොහෝ ගොවීන් වගා රක්ෂණ සැලසුම පිළිබඳව අසතුටට පත්ව ඇත. අලාභ තක්සේරු කිරීම්වල සහ වන්දි මුදල් ගෙවීම් වල විනිවිද පෙනෙන සුළු බව අඩු ය. වගා අලාභයන් අඩු තක්සේරුවට ලක් කිරීමේ දී ගොවීන්ගේ අසතුටට හේතු වී ඇත. මේ නිසා බොහෝ ගොවීන් වගා රක්ෂණ පිළිබඳ උනන්දුවක් නොමැති අතර එය ඔවුන්ට අමතර බරක් ලෙස ඔවුන් සලකනු ලබයි.

සමහර බැංකුවල ඇති බැංකු රීතීන් හේතුවෙන් රක්ෂණය වූ ගොවීන්ගෙන් 99%ක් පමණ වගා රක්ෂණ සැලසුමට සම්බන්ධ විය.

දිස්ත්‍රික්ක හතරේම රක්ෂණය වූ ගොවීන්ගෙන් 59%කට පමණ කෘෂිකාර්මික සහ ගොවි පුහුණු රක්ෂණ මණ්ඩලයේ සහ සෙලින්කෝ රක්ෂණ සමාගම (CICL) හි ඇති රක්ෂණ සැලසුම් පිළිබඳ අවබෝධයක් නොමැත.

## 2. බලංගොඩ ප්‍රදේශයේ ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනය

**පර්යේෂණ කණ්ඩායම:**

ආචාර්ය ටී.ඒ. ධර්මරත්න මහතා - සම්බන්ධීකාරක
ටී.පී. සෝමරත්න මහතා - සම පර්යේෂක

**අරමුණ:**

ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය මගින් කරන ලද ඉල්ලීමක් අනුව මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ප්‍රධාන අරමුණ වන්නේ බලංගොඩ ප්‍රදේශයේ ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා ශක්‍යතාව සොයා බැලීමයි.

**ඇස්තමේන්තු මුදල** - රු.37,250.00

එළවළු පළතුරු වෙළඳාම සඳහා ද, කෝපි, ගම්මිරිස්, විසිතුරු ශාක/පත්‍ර වැනි කෘෂිකාර්මික බෝග අපනයනය කිරීම සඳහා ද, නව ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීමට හැකියාවක් සහ ශක්‍යතාවන් ඇති බව වාර්තාව යෝජනා කරයි.
2007 පෙබරවාරි මස අධ්‍යයනය සම්පූර්ණ කර වාර්තාව ග්‍රාමීය කර්මාන්ත සහ ස්වයං රැකියා ප්‍රවර්ධන අමාත්‍යාංශය වෙත භාර දෙන ලදී

## 3. වී මෝල් කර්මාන්තය පිළිබඳව දත්ත පදනම

**පර්යේෂණ කණ්ඩායම:**

සී.පී. හතුරුසිංහ මහත්මිය - සම්බන්ධීකාරක

**සහාය:**

| | | |
|---|---|---|
| ඩබ්.ඒ.එන්. විජේසූරිය මහතා | - | සංඛ්‍යාන නිලධාරී |
| උපුල් ඒ.එස්. එදුසූරිය මහතා | - | සංඛ්‍යාන සහකාර |
| නිරෝෂා මල්කාන්ති මහත්මිය | - | සංඛ්‍යාන සහකාර |

**අධ්‍යයනයේ අරමුණ:**
වී මෝල් හිමියන් පිළිබඳව ද, වී කෙටීමේ ධාරිතාව පිළිබඳව ද, ගුණාත්මක සහල් නිපදවීම සඳහා පවතින යන්ත්‍රෝපකරණ පිළිබඳව ද, කැකුළු සහ තැම්බූ සහල් මෝල් පිළිබඳව ද, දත්ත පදනමක් සකස් කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී. අධ්‍යයන වාර්තාව සම්පූර්ණ කර අදාළ ප්‍රතිපත්ති සම්පාදකයන්හට භාර දෙන ලදී.

**අධ්‍යයනයේ සොයා ගැනීම්:**
මෙම සම්පාදනය මූලිකවම ස්වෙච්ඡාවෙන් ඉදිරිපත් වූ මෝල් හිමියන්ගේ පිළිතුරු මත පදනම් වී ඇති අතර සමස්තයම නියෝජනය නොකරයි.

සමීක්ෂණයට ලක් වූ සමස්ත මෝල් වලින් 26%ක් ප්‍රධාන වී නිෂ්පාදන දිස්ත්‍රික්ක වන අම්පාර, පොළොන්නරුව, අනුරාධපුර, හම්බන්තොට සහ කුරුණෑගල වැනි දිස්ත්‍රික්කවල පිහිටා ඇති බව සමීක්ෂණය මඟින් සොයා ගන්නා ලදී. සමීක්ෂණයට අනුව, මෝල් හිමියන් 187කට දිනකට වී මෙ.ටො.8 කට වඩා කෙටීමේ හැකියාව ඇත. මෙයින් මෝල් 134ක් (72%), ප්‍රධාන වී සැපයුම් දිස්ත්‍රික්කවල පිහිටා තිබේ.

වී සකසන ක්‍රමය සලකා බැලීමේ දී මෝල් 789ක් කැකුළු සහල් මෝල් වන අතර මෝල් 218ක් තම්බා සකසන ලද වී ඇඹරුම් මෝල් වේ. මෝල් 618 ක කැකුළු සහ තම්බන ලද යන දෙවර්ගයේම සහල් කොටනු ලැබේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ සියලුම මෝල් කැකුළු සහල් මෝල් වේ. අම්පාර දිස්ත්‍රික්කයේ වී මෝල් වලින් වැඩි ප්‍රමාණයක් තම්බා සකසන ලද වී ඇඹරුම්හල් වේ. තම්බා සකසන ලද වී ඇඹරුම් මෝල් මෙන්ම කැකුළු සහ තම්බන ලද වී යන දෙවර්ගයම කොටන මෝල් වලින් වැඩි ප්‍රමාණයක් පිහිටා ඇත්තේ පොළොන්නරුව සහ අනුරාධපුර දිස්ත්‍රික්කයන්හිය.

## 4. 2005/2006 මහ කන්නයේ වී මිලට ගැනීමේ රජයේ වැඩසටහන ඇගයීම

**පර්යේෂණ කණ්ඩායම:**

| | | |
|---|---|---|
| සී.පී. හතුරුසිංහ මහත්මිය | - | සම්බන්ධීකාරක |
| ටී.පී. සෝමරත්න මහතා | - | සම පර්යේෂක |

**ඇස්තමේන්තු මුදල:** රු. 300,000

**අධ්‍යයනයේ අරමුණ**
රජයේ වී මිලට ගැනීමේ වැඩ පිළිවෙලෙහි සාර්ථකත්වය ඇගයීම සහ ගැටලු හා විරෝධතා හඳුනා ගැනීම.

අධ්‍යයන වාර්තාව සම්පූර්ණ කරන ලද අතර මූලික සොයා ගැනීම් පහත සඳහන් වේ.

i මෙම වසරේ පළමු හය මස තුළ මිල ගණන් ක්‍රමයෙන් පහත වැටී තිබුණි. එමනිසා, ස්ථාවර කිරීමේ අරමුණට ළඟා වීමට නොහැකි විණි.

ii පැවතුන විවෘත වෙළඳපොළ වී මිල ගණන් නිෂ්පාදන වියදමට වඩා සුළු ප්‍රමාණයක් වැඩි විය.

iii පවතින දත්ත අනුව, දත්ත මූලාශ්‍ර දෙකක් වෙනස් වූ ප්‍රමාණ සපයයි. දිස්ත්‍රික් ලේකම්වරුන් මූල්‍ය කළමනාකරණය සිදු කළ බැවින්, විශ්ලේෂණය සඳහා ඔවුන් සපයන ලද දත්ත අපි යොදා ගත්තෙමු.

iv වැඩි වශයෙන් වී වගා කරන ප්‍රදේශ වල නිෂ්පාදන වියදම අඩු බැවින් රජය විසින් යෝජිත මිල ගණන් ක්‍රියාත්මක නොවීය. එබැවින්, විවෘත වෙළඳපොළ තුළ රජයේ මිලට ගැනීමේ වැඩසටහන සම්පූර්ණයෙන් නොසලකා හරින ලදී. එමනිසා, මෙම වැඩසටහන, එහි ප්‍රධාන අරමුණ සපුරා ගැනීමට අපොහොසත් වේ.

## 5. ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල පොළ වෙළඳපොළ (කාලීන වෙළඳපොළ) සංවර්ධනය

**පර්යේෂණ කණ්ඩායම:**

| | | |
|---|---|---|
| ටී.ඒ. ධර්මරත්න මහතා | - | සම්බන්ධීකාරක/අධි පර්යේෂක |
| සී.පී. හතුරුසිංහ මහත්මිය | - | සම පර්යේෂක/අංශ ප්‍රධාන |
| ටී.පී. සෝමරත්න මහතා | - | පර්යේෂණ නිලධාරී |
| රෝෂිනී රඹුක්වැල්ල මහත්මිය | - | පර්යේෂණ නිලධාරිණී |

**ඇස්තමේන්තු මුදල:** රු : 1,840,000.00

මෙම අධ්‍යයනය ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල පළාත් පාලන දෙපාර්තමේන්තු යටතේ ප්‍රාදේශීය සභා මඟින් පාලනය වන පොළ වෙළඳපළ පිළිබඳව අරමුණු විය. මෙම දිස්ත්‍රික්ක දෙක තුළ ප්‍රාදේශීය සභාව මඟින් පාලනය වන පොළ වෙළඳපොළ 56 ක් ඇත. මේ පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා සමීක්ෂණයක් සිදු කරන ලෙස බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම් කාර්යාලයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයට ඉල්ලීමක් කරන ලදී.

මූල්‍ය පහසුකම් බස්නාහිර පළාත් සභාව විසින් සපයන ලද අතර හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අලෙවි, ආහාර ප්‍රතිපත්ති සහ කෘෂි ව්‍යාපාර අංශයේ පර්යේෂණ නිලධාරීන් තිදෙනෙකු විසින් අධ්‍යයනය මෙහෙයවන ලදී.

පහත සඳහන් පරිදි අධ්‍යයනයේ ප්‍රධාන කොටස් තුනකි.

1. ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කයේ සෑම පොළ වෙළඳපොළක් සඳහාම පොළ වෙළඳපොළ සංවර්ධනය පිළිබඳ ගොනුවක් සැකසීම. සැලසුම් මඟින් පවතින යටිතල පහසුකම් වල මූලික අඩුපාඩු සහ ශක්තීන් ද, වෙළඳපොළවල් දියුණු කිරීමේ හැකියාවන් ද හඳුනා ගනු ලබයි. එකිනෙක පොළ වෙළඳපොළ සඳහා ප්‍රමුඛගත කිරීමේ ක්‍රියාකාරකම් හඳුනා ගැනීම ගොනුවේ අවසන් ප්‍රතිඵලය වේ. ඒ සඳහා තවදුරටත් සංවර්ධනය අවශ්‍ය වන පොළ වෙළඳපොළ තෝරා ගැනීම සඳහා තෝරා ගැනීමේ නිර්නායකයක් අධ්‍යයනය මඟින් දියුණු කරයි.

2. බස්නාහිර පළාත් සභාවට ඔවුන්ගේ ප්‍රතිපත්තිමය තීරණ සඳහා මූලික තොරතුරු සැපයීමේ අරමුණ ඇතිව, පොළ වෙළඳපොළ පිළිබඳව සවිස්තර සමාජ-ආර්ථික අධ්‍යයනයක් සිදු කෙරෙයි. මෙම අධ්‍යයනය පොළ වෙළඳපොළ වල ප්‍රමාණය සහ හැකියාවන් වැඩිදියුණු කිරීම සඳහා තවදුරටත් බස්නාහිර පළාත් සභාවට උපකාරී වේ.

3. මෙම දිස්ත්‍රික්ක දෙක තුළ ප්‍රාදේශීය සභා මඟින් පාලනය වන පොළ වෙළඳපොළ සඳහා "වෙළඳපොළ කළමනාකරණ සැලසුම" සකස් කෙරෙයි. පොළට සහභාගිවන්නන් හට පහසුකම් සැලසීමට උපදෙස් හා මඟපෙන්වීම සපයනු ලබන සැලසුම්කරණය සහ සංවර්ධනය සඳහා වූ ලියැවිල්ල කළමනාකරණ සැලසුම වේ.

**සොයා ගැනීම්:**

ඇතැම් අධ්‍යයන වල සඳහන් පරිදි මෙන්ම අපගේ නිරීක්ෂණයට ද අනුව, මාර්ග පහසුකම්, ඉඩම් ප්‍රමාණය, ආරක්ෂාව සහ නඩත්තුව, ගොඩනැගිලි, ජල සැපයුම, විදුලිය, දුරකතන පහසුකම්, වැසිකිලි, රථවාහන නවතා තැබීම, බඩු පැටවීම සහ බෑම, මතුපිට කාණු පද්ධතිය සහ නඩත්තුව මෙන්ම අපද්‍රව්‍ය එකතු කිරීම සහ බැහැර කිරීම හා සම්බන්ධ භෞතික ප්‍රශ්න රාශියක් පොළ වෙළඳපොළ වල ඇති බව තහවුරු විය. එමනිසා, වඩා හොඳ කළමනාකරණ පුරුදු සහ අනෙක් අවශ්‍ය පහසුකම් හඳුන්වා දීම සමග යටිතල පහසුකම් සංවර්ධනය පිළිබඳ ඉක්මන් ක්‍රියාමාර්ග පොළ වෙළඳපොළ සංවර්ධනය සඳහා ගත යුතුය.

**දැනට ක්‍රියාත්මක අධ්‍යයන**

1. අනෙකුත් ක්ෂේත්‍ර භෝග නිෂ්පාදනය සහ වෙළඳාම පිළිබඳ අධ්‍යයනය
2. ආහාර අනාරක්ෂිතතාව සහ අවදානම් තොරතුරු සිතියම්ගත කිරීමේ ව්‍යාපෘතිය

**වෙනත් ක්‍රියාකාරකම්**

1. **අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය මගින් කෘෂිකාර්මික හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයට සපයන ලද වාර්තා**
   - වී පිළිබඳ තත්ත්ව වාර්තාව - 2007 ජූලි
   - වී සහ සහල් මිල වැඩිවීම සඳහා හේතු - 2007
   - 2000 වසරේ රජය වී මිලට ගැනීමේ වැඩසටහන ඇගයීම 2000 - 2006/2007

2. **එළවළු සහ පලතුරු අපනයන පිළිබඳ සංකල්පීය පත්‍රිකාව - ආචාර්ය එල්.පී. රූපසේන**

   කෘෂිකාර්මික සංවර්ධනය සහ ගොවිජන සේවා අමාත්‍යාංශය මගින් කරන ලද ඉල්ලීමකට අනුව, එළවළු හා පලතුරු අංශයේ සියළුම පාර්ශව කරුවන් සමග කරන ලද තොරතුරු විමසීම මගින් එළවළු සහ පලතුරු අපනයනය පිළිබඳ සංකල්පීය පත්‍රිකාවක් සකස් කරන ලදී. මෙම පත්‍රිකාව මගින් වර්තමාන තත්ත්වය පැහැදිළි කර, ගැටලු සඳහා හේතු පවසන අතරම එළවළු සහ පලතුරු අංශයේ සංවර්ධනය සඳහා උපදෙස් ද ලබා දෙයි. එළවළු වගා බිම් ප්‍රමාණය 2000 වසර තෙක් වැඩිවීමේ ප්‍රවනතාවයක් පෙන්වන අතර එතැන් පටන් වරින් වර අඩු වැඩි වීම් වලට ලක්වෙයි. මෙම වරින් වර වෙනස් වීම් සඳහා දේශගුණය ප්‍රධාන සාධකයක් වේ. උදාහරණ ලෙස 2006 වසරේ අග භාගයේ ලැබුණ දැඩි වර්ෂාව එළවළු නිෂ්පාදනයට දරුණු ලෙස අලාභ හානි සිදු වීමට හේතු විය. පලතුරු වල සීඝ්‍ර වර්ධනයක් පසුගිය කාලය තුළ නිරීක්ෂණය කරනු ලැබිණි. ශ්‍රී ලංකාව එළවළු සහ පලතුරු නිෂ්පාදනයෙන් 2%ක පමණ ප්‍රමාණයක් අපනයනය කරයි. නමුත් එය දේශීය වෙළඳපොළ මිල ගණන් අනුව වරින් වර වෙනස් වේ. අඛණ්ඩ සැපයුමක් නොමැතිකම, ගුණාත්මක බවින් අඩුවීම, ඉහළ මිල ගණන්, ඉහළ බඩු ප්‍රවාහන ගාස්තු සහ නෞකා ගාස්තු භාණ්ඩාගාරයන්හි ප්‍රමාණවත් තරම් ඉඩකඩ නොමැති වීම යන ගැටලුවලට අපනයන කරුවන් මුහුණ දෙයි. ගුණාත්මක භාණ්ඩ සැපයීම සහ පළාත් ව්‍යාප්ති පද්ධතිය ශක්තිමත් කිරීම තුළින් ඵලදායිතාව දියුණු කර එමගින් නිෂ්පාදන කාර්යක්ෂමතාව වැඩි කිරීම, ඉදිරි හා පසු සම්බන්ධතා තුළින් සැපයුම් ජාලය සංවර්ධනය කිරීම හා එමගින් අලෙවි කාර්යක්ෂමතාව වැඩි කිරීම, හරිතාගාර තුළ පලතුරු සහ එළවළු වැවීම ප්‍රවර්ධනය, මුහුද මගින් ප්‍රවාහනය භාවිතා කිරීම, ගවේෂණය කිරීම සහ ක්‍රියාකාරිත්වය පෙන්වීමට දත්ත පදනමක් ස්ථාපිත කිරීම ආදිය උපදෙස් අතර වේ.

3. **ආහාර සුරක්ෂිතතාව සඳහා වන ජාතික වැඩසටහන යටතේ ආහාර අලෙවිය සංවර්ධනය සඳහා යෝජනාවක් - ආචාර්ය එල්.පී. රූපසේන මහතා.**

   ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ඉල්ලීමකට අනුව, ශ්‍රී ලංකාවේ කාර්යක්ෂම ආහාර අලෙවි කිරීමේ ක්‍රමයක් ඇති කිරීමට සංවර්ධන යෝජනාවක් සකස් කරන ලදී. ක්‍රමෝපායයන් 6 ක් මෙම ලියවිල්ල

තුළ අන්තර්ගත වේ. 1) රාජ්‍ය හා පෞද්ගලික සහයෝගිතාව ප්‍රවර්ධනය. 2) අලෙවි තොරතුරු සැලැස්මක් සකස් කිරීම. 3) වෙළඳපොළට ප්‍රවිෂ්ඨවීමට භෞතික සාධක දියුණු කිරීම. 4) වෙළඳපොළ ස්ථාන වැඩිදියුණු කිරීම. ආයතන, වෙළඳ සමාගම් සහ සමුපකාර ශක්තිමත් කිරීම. 5) වෙළඳපොළ සඳහා හොඳ නිෂ්පාදනයට ගොවීන් ශක්තිමත් කිරීම සහ 6) ගොවිතැන ව්‍යාපාරයක් ලෙස කරගෙන යාමට ගොවීන් සවිබල ගැන්වීම. යෝජිත වැඩසටහනෙහි ප්‍රධාන කරුණු 4 ක් අඩංගු වේ. 1) වෙළඳපොළ තොරතුරු, 2) වෙළඳපොළ යටිතල පහසුකම්, 3) ගොඩනැගිලි ප්‍රමාණය. 4) අපනයන ප්‍රවර්ධනය.

## 4. 2007 වසරේ සහල් මිල ඉහළ යාම පිළිබඳ වැඩමුළුව

ඉහළ හාල් මිල ගණන් වලට හේතු වන සාධක සෙවීම සඳහා 2007 නොවැම්බර් 27 වන දින හාල් මිල ඉහළ යාම පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. ගරු කෘෂිකර්ම සහ ගොවිජන සේවා අමාත්‍යතුමන්, ගරු කෘෂිකර්ම ඇමතිතුමා සහ ගරු ගොවිජන සේවා නියෝජ්‍ය ඇමතිතුමා වැඩමුළුවේ ප්‍රධාන ආරාධිතයන් විය. අදාළ රාජ්‍ය සංවිධාන, වෙළඳ සමාගම්, ගොවි සංවිධාන සහ පාරිභෝගික සංවිධාන වල නියෝජිතයෝ එයට සහභාගි වූහ. නිෂ්පාදනය අඩු වීම, පාරිභෝගිකයින් පාන් පිටි වෙනුවට හාල් පිටි භාවිතා කිරීම, සත්ත්ව ආහාර ලෙස හාල් භාවිතය සහ ලෝක වෙළඳපොළ ඉහළ මිල ගණන් වෙළඳපොළේ හාල් මිල ඉහළ යාමට හේතු වන බව වැඩමුළුවේ දී සොයා ගනු ලැබිණි. පුද්ගලික වෙළඳුන් සතුව ඇති තොග ඇස්තමේන්තු කිරීමේ උපක්‍රමයක් සකස් කළ යුතු බව වැඩමුළුවට සහභාගිවූවන් අවධාරණය කරන ලදී.

## 5. ආහාර ද්‍රව්‍ය මිල ගණන් 2000 - 2006

ප්‍රධාන ආහාර ද්‍රව්‍ය වල නිෂ්පාදන, තොග සහ සිල්ලර මිල ගණන් මෙහි අඩංගු වේ. ඊට අමතරව කාලීන මිල දර්ශකය ද මෙම ලියැවිල්ලට ඇතුළත් වේ.

# සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය

මෙම අංශයෙහි ප්‍රධාන කාර්යභාරය වන්නේ කෘෂිකාර්මික හා ගොවි කටයුතු ආශ්‍රිත තොරතුරු රැස්කිරීම හා ඒවා ගොවීන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් වෙත ලබාදීමයි. ඒ අනුව පර්යේෂකයන්, සැලසුම් කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, උපාධි අපේක්ෂකයන්, ගොවි මහතුන් සහ වෙනත් උනන්දුවන පුද්ගලයන් ඇතුළු විශාල පිරිසක් මෙයින් ප්‍රයෝජනය ලබයි. දත්ත සංවර්ධන ඒකකය, පරිගණක ඒකකය එක්ව කටයුතු කරන අතර පුස්තකාලය සහ ප්‍රකාශන ඒකකය යනුවෙන් මෙම අංශය ප්‍රධාන ඒකක 4 කින් සමන්විත වේ. දත්ත සංවර්ධන ඒකකය හා පරිගණක ඒකකය මගින් සංඛ්‍යාත්මක තොරතුරු රැස්කිරීම හා විශ්ලේෂණය කිරීම සිදු කරනු ලබන අතර ග්‍රන්ථ නාමාවලි තොරතුරු සැපයීමේ මධ්‍යස්ථානය වශයෙන් පුස්තකාලය කටයුතු කරනු ලබයි. ප්‍රකාශන ඒකකය ද මෙම අංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාකාරී වේ.

## 1. දත්ත සංවර්ධන ඒකකය

ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍ර වලින් රැස් කරගන්නා දත්ත ඇසුරින්, කෘෂි භෝග, පශු සම්පත්, ජනගහනය, සහ වෙනත් වැදගත් සංඛ්‍යාත්මක තොරතුරු ආශ්‍රයෙන් දත්ත පදනමක් (Database) පවත්වාගෙන යාම මෙම අංශයෙහි කාර්යභාරය වේ. 2007 වර්ෂය තුළ දී පහත දැක්වෙන දත්ත මාලාවන් යාවත්කාලීන කර ඇත.

1. මධ්‍ය වාර්ෂික ජනගහනය සහ උපත්
2. වී වගා බිම් ප්‍රමාණය, වගා කළ භූමි ප්‍රමාණ, සාමාන්‍ය අස්වැන්න, නිෂ්පාදනය සහ වගා කළමනාකරණය පිළිබඳ තොරතුරු

3. වී නොවන භෝග වල වගා බිම් ප්‍රමාණය හා නිෂ්පාදනය
4. කෘෂි භෝග වල සාමාන්‍ය මාසික තොග මිල
5. කෘෂි භෝගවල ආනයන හා අපනයන
6. ආහාර ද්‍රව්‍යවල පාරිභෝගික දත්ත
7. පොහොර සහ කෘෂි යෙදවුම්
8. දළ දේශීය නිෂ්පාදනයේ ආංශීය වැදගත්කම

ධීවර කටයුතු පිළිබඳ දත්ත එකතු කිරීම වසරේ අග භාගයේදී ආරම්භ විය. එම දත්ත ශ්‍රී ලංකා ධීවර වාර්ෂික ප්‍රකාශනය ජන සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තා හා ශ්‍රී ලංකා ප්‍රතිපත්ති ආයතනය මගින් ප්‍රකාශිත වාර්තා වලින් උපුටා ගන්නා ලදී. පහත දැක්වෙන දත්ත එහි අන්තර්ගත වේ.

1. නාවික ධීවර නිෂ්පාදනය
2. මුහුදු බඩ, ගැඹුරු මුහුදේ සහ මිරිදිය අනුව ධීවර නිෂ්පාදන ව්‍යාප්තිය
3. දිස්ත්‍රික්ක අනුව ධීවර නිෂ්පාදන ව්‍යාප්තිය
4. මාළු බීජ නිෂ්පාදනය
5. මාළු දැල් සහ ආම්පන්න නිෂ්පාදනය

### දත්ත සඳහා ඉල්ලීම්

2007 වර්ෂය තුළ, දත්ත බැංකුව වෙත ලැබුණු මුළු ඉල්ලීම් සංඛ්‍යාව 127කි. එයින් ඉල්ලීම් 77ක ප්‍රමාණයක් බාහිර ඉල්ලීම් වන අතර ඉතිරි වූ ඉල්ලීම් 50ක ප්‍රමාණය අභ්‍යන්තර (ආයතනය තුළ) ඉල්ලීම් වේ. එම ඉල්ලීම් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

| ඉල්ලීම් වර්ගය | සංඛ්‍යාව | ප්‍රතිශතය(%) |
|---|---|---|
| විශ්ව විද්‍යාල ආචාර්යවරුන්/උපාධි අපේක්ෂකයන්/වෙනත් සිසුන් | 31 | 40.3 |
| පුද්ගලික කොම්පැනි සහ පුද්ගලික ආයතන | 17 | 22.1 |
| අමාත්‍යාංශ/රාජ්‍ය දෙපාර්තමේන්තු/අර්ධ රාජ්‍ය සංවිධාන නිලධාරීන් | 12 | 15.6 |
| ජාත්‍යන්තර සංවිධාන/තානාපති කාර්යාල | 5 | 6.5 |
| පුද්ගලික අය සහ නිදහස් උපදේශක සේවා | 7 | 9.1 |
| ගොවි සමාගම් / ගොවි සංවිධාන | 2 | 2.6 |
| මාධ්‍යවේදීන් | 2 | 2.6 |
| බැංකු | 1 | 1.3 |
| **එකතුව** | **77** | **100.0** |

### දත්ත සැපයීමෙන් ලැබූ ආදායම

2007 වර්ෂය තුළ දී, බාහිර අයඳුම්කරුවන් සඳහා දත්ත සැපයීම තුළින් ඉපැයූ මුළු ආදායම රු: 35,083.30 ක් වන අතර බාහිර හා අභ්‍යන්තර වශයෙන් නොමිලේ දත්ත සැපයීමේ ඇස්තමේන්තුගත පිරිවැය රු: 4031.78 කි.

## 2. පරිගණක ඒකකය

සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශයෙහි පරිගණක ඒකකය, දත්ත සැකසීම හා විශ්ලේෂණය සඳහා අවශ්‍ය පහසුකම් සපයයි. ඒකකයෙහි ප්‍රධාන කාර්යභාරය පහත සඳහන් ක්‍රියාකාරකම් ආශ්‍රයෙන් සිදු වේ.

i. ආයතනය මගින් සිදු කරන ලද අධ්‍යයන සඳහා දත්ත විශ්ලේෂණය
ii. දත්ත බැංකුව සඳහා දත්ත සකස් කිරීම සහ විශ්ලේෂණය
iii. පද්ධති සංවර්ධනය
iv. පුහුණුව

**දත්ත විශ්ලේෂණය**

වර්ෂය තුළ පහත සඳහන් අධ්‍යයනයන්ට අදාළ දත්ත විශ්ලේෂණ කටයුතු සම්පූර්ණ කර ඇත.

1. උඩරට එළවළු වගා ක්‍රමයේ සංරක්ෂණ ක්‍රම ව්‍යාප්තියේ නැඹුරුව හා ප්‍රතිඵල පිළිබඳ අධ්‍යයනය
2. උඩවලව ජාතික වන උද්‍යානයේ කිරි ගව ප්‍රශ්නය පිළිබඳ අධ්‍යයනය
3. ශ්‍රී ලංකාවේ විවිධ අංශ වල ජලය බෙදා හැරීම

**දත්ත බැංකුව ක්‍රියාකාරකම්**

දත්ත ඇතුළත් කිරීම, දත්තයන්හි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම හා පද්ධති සංවර්ධනය ලෙස කාණ්ඩ 3 කට අදාළ වන පරිදි දත්ත බැංකුව හා සම්බන්ධ කාර්යයන් ක්‍රියාවට නංවන ලදී. එලෙසම, නිෂ්පාදන පිරිවැය, ආදායම සහ කෘෂි කාර්මික භෝගයන්ට අදාළ ඉකුත් දත්තයන්හි නිරවද්‍යතාවය තහවුරු කොට ඇති අතර ඉතා ප්‍රයෝජනවත් අන්දමින් දත්ත ලබා ගැනීම සඳහා දත්ත බැංකු පද්ධතිය නවීකරණය කර ඇත.

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ වෙබ් අඩවිය**

ප්‍රතිපත්ති සම්පාදකයන් ප්‍රමුඛ, ආයතනයේ දත්ත භාවිතා කරන විවිධ කොටස්වල පහසුව සඳහා ආයතනයේ වෙබ් අඩවිය www.harti.slt.lk වර්ධනය කරනු ලැබූ අතර ඒ අනුව වෙළඳපොළ තොරතුරු විවරණිකාව සතිපතා යාවත්කාලීන කරනු ලැබේ. එමගින්, දෛනික මිල වෙනස්වීම ගැන සොයා බලන ගොවීන්ට හා වෙළඳුන්ට පහසුවෙන් තොරතුරු දැන ගැනීමට හැකි වේ. ඊට අමතරව මූලික කෘෂි තොරතුරු ලබාගැනීමට මෙමගින් හැකිය.

**පුහුණු කටයුතු**

**සම්බන්ධීකරණය:** එම්.ඩී.එල්. සෙනරත් - ජ්‍යෙෂ්ඨ වැඩසටහන් විශ්ලේෂක

ආයතනයේ ලිපිකරු කාර්ය මණ්ඩලයේ පරිඝනක සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් ලේඛකාධිකාරිණියගේ ඉල්ලීම පරිදි ක්‍රියාත්මක කරන ලදී.

**3. පුස්තකාලය**

පුස්තකාලය සතු මූලික අරමුණ වන්නේ, ආයතනයෙහි පර්යේෂණ කාර්ය මණ්ඩලයේ මෙන්ම වෙනත් උනන්දුවන පුද්ගලයන්ගේ සහ නියෝජිත ආයතනයන්හි ප්‍රයෝජනය පිණිස, කෘෂිකාර්මික අංශයට සම්බන්ධ තොරතුරු එක් රැස් කිරීම, ගොනු කිරීම, සමුද්ධරණය සහ බෙදා හැරීමයි. වර්ෂය තුළ කාර්ය මණ්ඩලය වෙත නිකුත් කර ඇති පොත් සංඛ්‍යාව 1059 ක් සහ ශාස්ත්‍රීය සඟරා සංඛ්‍යාව 378 කි. එමෙන්ම, පුස්තකාලය පරිහරණය සඳහා පැමිණි බාහිර පුද්ගලයන්ගේ සංඛ්‍යාව 169 ක් වන අතර එයින් බහුතරය විශ්ව විද්‍යාල සිසුන් වේ. වර්තමානයේ දී පුස්තකාලය සතු මුළු පොත් සංඛ්‍යාව 21013 ක් වූ අතර සඟරා ප්‍රමාණය 20,200 ක් වේ.

### වර්තමානයේ දී පොත්, සඟරා, වාර්තා, සිතියම් හා සංයුක්ත තැටි ලබා ගැනීම

වසර තුළ, පුස්තකාලය විසින් ලබාගත් පොත් සහ වාර්තා සංඛ්‍යාව 319 කි. එයින් 91 ක ප්‍රමාණයක් සෘජු මිල දී ගැනීම් වූ අතර ඉතිරි 203ක් අයිතමයන්, හුවමාරු පදනම මත හෝ සහයෝගිතා පදනම මත ලබාගන්නා ලදී. දේශීය විදේශීය ආයතන වලින් පුවත් වාරික, පුවත් හසුන් හා වාර්ෂික වාර්තා රාශියක් හුවමාරු පදනම මත සහ 25ක් සහයෝගිතා පදනම මත ලැබී ඇත. වර්ෂය තුළ ලද 171 ප්‍රකාශන අතුරෙන් විදේශීය සඟරා 22 ක් සහ දේශීය සඟරා 42 ක් වාර මුදල් ගෙවා පුස්තකාලය මඟින් මිලට ගෙන ඇත.

### පුස්තකාල සේවා

කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ (CARP) පුස්තකාලය මඟින් පවත්වාගෙන යනු ලබන ජාතික කෘෂිකාර්මික ග්‍රන්ථ නාමාවලි (NAB) දත්ත සමුදාය (2006) සඳහා පොත් හා සඟරා ලිපිවලට අදාළ පරිඝනක ගත දත්ත අඛණ්ඩව සපයා ඇත. ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය සහ බාහිර වැඩසටහන් ඉල්ලීම් තොරතුරු, ලිඛිත විමසුම් වැනි ප්‍රලේඛන සේවා වැනි අදාළ පුස්තකාල සේවා සපයන ලද අතර ඡායා පිටපත් සේවාව ද සපයන ලදී. පුස්තකාලය තුළ පර්යේෂණ කාර්ය මණ්ඩලය සඳහා (ADSL) පහසුකම ස්ථාපනය කරමින් පරිඝනක පහසුකම් වැඩි දියුණු කරන ලදී. පැරණි සඟරා බැඳීම, පුවත්පත් ලිපි එකතුව පවත්වාගෙන යෑම, අදාළ වර්ෂය තුළ තවදුරටත් ඉදිරියට ගෙන යන ලදී.

### ප්‍රකාශන හුවමාරු වැඩසටහන

2007 වර්ෂය තුළ ආයතනය විසින් නිකුත් කළ ප්‍රකාශන 10ක්, දේශීය පුස්තකාල 10ක් සහ විදේශීය ආයතනයන් හි පුස්තකාල 07ක් වෙත යවා ඇත.

## 4. ප්‍රකාශන ඒකකය

ප්‍රකාශන ඒකකය පර්යේෂණ වාර්තා, වාර ප්‍රකාශන, සඟරා, පුවත් හසුන්, විවරණිකා, අත්පොත්, පත්‍රිකා හා වෙනත් තොරතුරු සටහන් ප්‍රකාශන ආදිය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් සංස්කරණය කොට ප්‍රකාශයට පත් කිරීමේ කාර්යයෙහි නියුතුව සිටියහ. තව ද, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් මෙහෙයවීම ද මෙමඟින් ඉටුකරනු ලැබීය. අදාළ කාලය තුළ, ප්‍රකාශන ඒකකය පහත දක්වා ඇති ප්‍රදර්ශන සඳහා සහභාගි විය.

1. "පුලතිසි නවෝදය" වෙළඳ ප්‍රදර්ශනය හා සන්දර්ශනය - 2007 මාර්තු මස 29 සිට අප්‍රේල් 1 දක්වා
2. "ගොවි සතිය ප්‍රදර්ශනය" 2007 ඔක්තෝබර් 12-16 දක්වා, මහඉලුප්පල්ලම කෘෂි පර්යේෂණ මධ්‍යස්ථානය

අදාළ වර්ෂය තුළ පහත සඳහන් පර්යේෂණ වාර්තා නිකුත් කරන ලදී.

1. ක්ෂුද්‍ර ව්‍යවසායකත්වය පිළිබඳව ක්ෂුද්‍ර මූල්‍ය සේවා වල බලපෑම පිළිබඳ අධ්‍යයනය : සමෘද්ධි සහ ශ්‍රී ලංකාවේ කෘෂි ව්‍යවසායකයින් යෙදවුම් මුදල් පිළිබඳ සංඛ්‍යා දත්ත මත අධ්‍යයනය
2. පළාත් සභා ක්‍රමය සහ කෘෂිකාර්මික සංවර්ධනය පිළිබඳ විධිමත් වැඩ වාර්තා 2007 ජනවාරි 15-16
3. පළාත් සභා ක්‍රමය තුළ ඉඩම් විෂයයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ විද්වත් වැඩමුළුවේ වාර්තාව, 2007 - පෙබරවාරි 19
4. මහවැලි "එච්" කලාපයේ ජල පංගු බෙදීම පිළිබඳ ඇගයීම් අධ්‍යයනය
5. කුරුඳු, ගම්මිරිස්, පොල් සහ තේ වෙළඳපොළ වල ව්‍යුහය, පැවැත්ම හා කාර්ය සාධනය ඇගයීම පිළිබඳ අධ්‍යයනය
6. කෘෂි භෝග විමර්ශනය 2005

7. කුරුණෑගල දිස්ත්‍රික්කයේ කිරි නිෂ්පාදන පිරිවැය සඳහා බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය
8. කෘෂිකාර්මික පැතිකඩ - 2006
9. පළාත් සභා ක්‍රමය තුළ වාරි මාර්ග විෂයයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ විද්වත් වැඩමුළුවේ වාර්තා 2007 පෙබරවාරි 20
10. මහවැලි "එච්" කලාපයේ දෙවන හා තෙවන පරම්පරාවල පදිංචි කරුවන්ගේ සමාජ-ආර්ථික තත්ත්වය පිළිබඳ අධ්‍යයනය.

**අදාළ කාලයේ දී පහත සඳහන් ප්‍රකාශන ද නිකුත් කරන ලදී.**

1. "ගොවිජනතා", ජනවාරි - මාර්තු 2007
2. Sri Lanka Journal of Agrarian Studies, Vol. II - No 1, 2006
3. ගොවි කටයුතු අධ්‍යයන වෙළුම 6, අංක 1
4. වාර්ෂික වාර්තාව 2005 සිංහල, දමිළ සහ ඉංග්‍රීසි වාර්තා
5. වාර්ෂික වාර්තාව 2006 - දමිල සහ ඉංග්‍රීසි
6. හෙ.ගො.ප.පු. ආයතනයේ පුවත් හසුන
7. ආහාර ද්‍රව්‍ය විවරණිකාව
8. මාසික ආහාර භෝග විමසුම

**අවසන් කළ අධ්‍යයන**

**1. කෘෂි භෝග විවරණිකාව - 2005**

**පර්යේෂණ කණ්ඩායම:**

| | | |
|---|---|---|
| අචාර්ය පී.එම්. හේනේගෙදර | - | සම්බන්ධීකාරක/අංශ ප්‍රධාන, සංඛ්‍යාන හා දත්ත සැකසුම් අංශය |
| ආචාර්ය එම්.එස්. සේනානායක | - | සහාය අධි පර්යේෂක |
| එම්.එම්.එම්. අහියර් මහතා | - | සහාය අධි පර්යේෂක |
| ආචාර්ය ඩබ්.ඩී. වික්‍රමසිංහ මිය | - | ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී |
| ඩබ්.එච්.ඒ. ශාන්ත මයා | - | පර්යේෂණ නිලධාරී |
| රුචිනි විදානපතිරණ මිය | - | පර්යේෂණ නිලධාරී |

**දත්ත විශ්ලේෂක**

| | | |
|---|---|---|
| කේ.ඩී.එස්. ආරියසිංහ මයා | - | දත්ත විශ්ලේෂක |
| ටී.එන්.ආර්. ප්‍රනාන්දු මයා | - | දත්ත විශ්ලේෂක |
| එම්.ඩී.එල්. සෙනරත් මයා | - | ජ්‍යෙෂ්ඨ ක්‍රම විශ්ලේෂක / වැඩසටහන් සම්පාදක |

1998 වර්ෂයේ සිට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් පලකරනු ලබන කෘෂි භෝග විවරණිකා ග්‍රන්ථ මාලාවේ 4 වැන්න කෘෂි භෝග විවරණිකාව (2005) වේ. මෙම අධ්‍යයනය මගින් ප්‍රධාන කෘෂි ආහාර ද්‍රව්‍යන් 14ක කාලානුරූප දත්ත විශ්ලේෂණයක් කෙරේ. එසේම, වර්තමාන හා අනාගත ආහාර අවශ්‍යතාවයන්ට අනුකූලව අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ දී ඇතිවන බාධාවන් හා විභවතාවයන් එනම් භූමිය, නිෂ්පාදනය වෙළඳ පොළ මිල, බාහිර වෙළඳාම, ඒක පුද්ගල පරිභෝජනය හඳුනා ගැනීම ද මෙමගින් අපේක්ෂා කෙරේ. මෙහි දී වී, කුරක්කන්, බඩ ඉරිඟු, මුං ඇට, කව්පි, උඳු හා සෝයා බෝංචි, ලොකු ළූණු, රතු ළූණු, අර්තාපල්, මඤ්ඤොක්කා, බතල, තල හා රට කජු යන ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන් දත්ත විශ්ලේෂණය කර ඇත.

අධ්‍යයනයේ නිගමන වලට අනුව බොහෝ කෘෂි භෝග වල වගා බිම් ප්‍රමාණය සහ නිෂ්පාදනය මෑත කාලයේ දී පහළ ගොස් ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් එම භෝග වල ආනයනය වැඩි වී ඇත. නිෂ්පාදන වියදම වැඩි වීම හා ආදායම අඩු වීම නිසා වී ගොවිතැන අකාර්යක්ෂම ව්‍යාපාරයක් බවට පත්ව ඇත. මෙම

වාර්තාවට අනුව වාරි පෝෂිත ප්‍රදේශවල පමණක් වී වගාව ලාභදායී වී ඇත. ඊට හේතුව යන්ත්‍රෝපකරණ භාවිතයයි. මුළු නිෂ්පාදන පිරිවැයෙන් 50%ක් පමණ ශ්‍රමය සඳහා වැය වේ. ඒ අනුව, ලාභදායිත්වය තීරණය වීම සඳහා ශ්‍රම කුලිය තීරණාත්මකව බලපා ඇත. එසේම, වී ගොවිතැන ලාභදායී වීම සඳහා ගොවියා සතු සම්පත් සඳහා වන ආරෝපණ පිරිවැය ද බලපානු ලබයි. ආරෝපිත පිරිවැයක් නොමැති විට, ලාභදායී බව පෙනුනත් එවැනි ඇස්තමේන්තු යථාර්තයෙන් තොරය.

එක් එක් භෝගයන් සඳහා කරන ලද සවිස්තරාත්මක විශ්ලේෂයන් පිරිවැය ප්‍රතිලාභ, වෙළඳපොළ පාරිභෝජන හා රාජ්‍ය ප්‍රතිපත්ති දේශීය කෘෂිකර්මය නගා සිටුවීම සඳහා පදනම් කොට ගෙන ඇත. අධ්‍යයනයේ නිගමන ගරු කෘෂිකර්ම අමාත්‍ය හේමකුමාර නානායක්කාර මහතාගේ ප්‍රධානත්වයෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පවත්වන ලද විද්වත් වැඩ මුළුවකදී සාකච්ඡාවට භාජනය කරන ලදී.

## 2. කෘෂිකාර්මික පැතිකඩ - 2006

**ව්‍යාපෘති කණ්ඩායම:**

ආචාර්ය පී.එම්. හේනෙගෙදර - අංශ ප්‍රධාන
ඊ.එන්.ආර්. ප්‍රනාන්දු මහතා - දත්ත විශ්ලේෂක

**දත්ත විශ්ලේෂණය:**

එම්.ඩී.එල්. සෙනරත් මහතා - ජ්‍යෙෂ්ඨ ක්‍රම විශ්ලේෂක / වැඩසටහන් සම්පාදක
එන්.පී. ජයනෙත්ති මිය - දත්ත සහකාර

2006 කෘෂිකාර්මික පැතිකඩ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ද දත්ත අනුසාරයෙන් ප්‍රකාශයට පත් කොට ඇත. ප්‍රධාන ධාන්‍ය භෝගයන් හි වපසරිය හා නිෂ්පාදනය, ඒවායේ නිෂ්පාදන පිරිවැය, ආනයන හා අපනයන දත්ත සහ අලෙවි තොරතුරු පදනම් කරගනිමින් මෙම කෘෂිකාර්මික පැතිකඩ පිළියෙල කොට ඇත. සංඛ්‍යාත්මක විවරණිකාවක් ලෙස ප්‍රධාන කෘෂිකාර්මික ද්‍රව්‍යයන්හි මූලික තොරතුරු මෙහි ඇතුළත් වේ. එනම් ධාන්‍ය, රනිල බෝග, අල වර්ග, එළවළු, කුළු බඩු කර්මාන්ත සහ අනෙකුත් බෝගයන් වේ. මෙම වාර්තාව ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික භෝග අංශයෙහි වර්තමාන තත්ත්වය පිළිබඳ පහසුවෙන් පරිශීලනය කළ හැකි සංඛ්‍යාන අත්පොතක් ලෙස එළි දැක්වීමයි. මෑත කාලීන තොරතුරු ඇතුළත් මෙම ලේඛනය, පුළුල් පරාසයක විහිදී සිටින කෘෂිකාර්මික සංවර්ධන අංශයෙහි නියුතු වුවන් සඳහා ප්‍රයෝජනවත් වනු ඇත.

### අනෙකුත් කටයුතු

**ප්‍රසිද්ධ දේශන මාලාව - සම්බන්ධීකාරක - ආචාර්ය පී.එම්. හේනේගෙදර**

ශ්‍රී ලංකාවේ ප්‍රධාන සමාජ-ආර්ථික හා සංවර්ධන කරුණු වලට අදාළව දේශන 05ක් අදාළ කාලය තුළ සංවිධානය කරන ලදී. ඊට අයත් වන්නේ

1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධනය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම පිළිබඳ දේශනය පේරාදෙණිය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ආචාර්ය රොහාන් විජේකෝන් මහතා විසින් පවත්වන ලදී.
2. ග්‍රාම සංවර්ධනයේ දී අතිවන අභියෝග පිළිබඳ දේශනය-පුත්තලම දිස්ත්‍රික්කයේ රාජ්‍ය නොවන සංවිධානයක් වන 'විනිවිද' ආයතනයේ සම්බන්ධීකරණ ලේකම් කේ.ඩී. පීරිස් මහතා විසින් පවත්වන ලදී.

3. ශ්‍රී ලංකාවේ වර්ධනය වන අතිරේක භෝග වගාව පිළිබඳ දේශනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මහඉලුප්පල්ලම කෘෂි පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ රණවීර බණ්ඩා මහතා විසින් පවත්වන ලදී.
4. යහ පාලනය හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ දේශනය ශ්‍රී ලංකා ජාතික සර්වෝදය ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය විනයා ආරියරත්න මැතිතුමා විසින් පවත්වන ලදී.
5. සංවර්ධන ප්‍රවීනයන්ගේ කාර්ය භාරය: ශ්‍රී ලංකාව ආශ්‍රයෙන්, පිළිබඳ දේශනය-රුහුණු විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය රණවීර බණ්ඩා මහතා විසින් පවත්වන ලදී.

## මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

කෙටි කාලීන පුහුණු වැඩසටහන්, වැඩමුළු මෙන්ම සම්මන්ත්‍රණ සහ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් සංවිධානය කරනු ලබයි. මෙම සියලු වැඩසටහන් සඳහා සම්පත් දායකයන් වශයෙන් බොහෝ විට කටයුතු කරනු ලබන්නේ ආයතනයේ පර්යේෂණ ප්‍රජාව ය. ඒ හැරුණු විට, විශේෂ අවශ්‍යතාවයන් මත විශ්ව විද්‍යාල වලින් ද, රාජ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය නොවන ආයතන වලින් ද, සම්පත් දායකයින්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**අවසන් කරන ලද පුහුණු වැඩසටහන්.**

1. ග්‍රාමීය සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම සහ කළමනාකරණය සඳහා ප්‍රජා සහභාගිත්ව ක්‍රමවේදය (ගැමි පිවිසුම් ක්‍රමවේදය) භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන (ගම නැගුමට සිතට සවිය)

   **සම්බන්ධීකාරක:** ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා - සහාය අධි පර්යේෂක/අංශ ප්‍රධාන මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

   රජයේ "ගම නැගුම" වැඩසටහන යටතේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය මගින් ග්‍රාමීය ප්‍රදේශයන්හි ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම පිළිබඳව න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම මෙම වැඩසටහනේ පරමාර්ථය විය. මේ සඳහා 2007 වසරේ දී ආයතනය මගින් පුහුණු වැඩසටහන් මාලාවක් පවත්වන ලදී. "ගම නැගුම" වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. එමනිසා, එම සැලසුම් සකස් කිරීම පිළිබඳ පුහුණුවක් "ගම නැගුම" වැඩසටහන යටතේ කටයුතු කරනු ලබන නිලධාරීන් විසින් ලබා තිබීම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඉවහල් වන්නකි. මෙම පුහුණු වැඩසටහන්වලින් බලාපොරොත්තු වූයේ එම අවශ්‍යතාවය සපුරා දීම ය.

   පුහුණු වැඩසටහන්වල මූලික තේමාව වූයේ "ගම නැගුමට සිතට සවිය" යන්නයි. පුහුණු වැඩසටහනෙහි මූලික පරමාර්ථය වූයේ සහභාගිත්ව සැලසුම්කරණය හා කළමනාකරණය පිළිබඳ සංකල්ප හා ක්‍රම විධි පිළිබඳව සහභාගි වන්නන්ගේ දැනුම වර්ධනය කිරීමයි. ඊට අමතරව, ග්‍රාමීය සංවර්ධන සැලසුම් සකස් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීමේ දී සහභාගිත්ව ගැමි පිවිසුම් ක්‍රමය හා ව්‍යාපෘති චක්‍ර කළමනාකරණය වැනි සහභාගිත්ව ශිල්ප ක්‍රම යොදා ගැනීම පිළිබඳ සහභාගි වන්නන්ගේ හැකියාවන් වර්ධනය කිරීම ද මෙහි දී බලාපොරොත්තු විය.

   මෙම අරමුණු සපුරා ගැනීම සඳහා හම්බන්තොට, බදුල්ල, පුත්තලම, දිස්ත්‍රික්කයන්හි දින 05ක පුහුණු වැඩසටහන් දෙකක් හා ඉන් ලැබූ අත්දැකීම් පාදක කර ගනිමින් දින 05 ක පුහුණු වැඩසටහනක් ද පවත්වන ලදී. මෙයින් පළමු පුහුණු වැඩසටහන (දින 05 ක) පවත්වන ලද්දේ අගුණකොළපැලැස්සේ පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ ය. මෙම වැඩසටහන 2007

අගෝස්තු 13 සිට 17 දක්වා පවත්වන ලදී. හම්බන්තොට දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් තෝරා දුන් ගම නැගුම වැඩසටහනට සම්බන්ධව කටයුතු කරනු ලබන රාජ්‍ය නිලධාරීන් 24ක් මෙම පුහුණු වැඩසටහන සඳහා සහභාගී විය.

දෙවෙනි පුහුණු වැඩසටහන පවත්වන ලද්දේ බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගම නැගුම වැඩසටහනට සම්බන්ධ වී කටයුතු කරනු ලබන රාජ්‍ය නිලධාරීන් සඳහා ය. එම වැඩසටහන 2007 ඔක්තෝබර් මස 04 සිට 08 දින දක්වා (දින 05 කි) බණ්ඩාරවෙල පිහිටි ගොවිජන සේවා පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී. මේ සඳහා බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් තෝරා දුන් රාජ්‍ය නිලධාරීන් 27 දෙනෙකු සහභාගී විය. තුන්වන සහභාගිත්ව ගැමි පිවිසුම (ගම නැගුමට සිතට සවිය) පවත්වන ලද්දේ පුත්තලම දිස්ත්‍රික්කයේ නිලධාරීන් සඳහා ය. මේ සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් වරුන් විසින් නම් කරන ලද ගම නැගුම ව්‍යාපෘතියට සම්බන්ධව කටයුතු කරනු ලබන රාජ්‍ය නිලධාරීන් 26 දෙනෙකු සහභාගී විය. හම්බන්තොට සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි කලින් කරන ලද පුහුණු වැඩසටහන් වලින් ලබා ගත් අත්දැකීම් අනුව මෙම වැඩසටහන සඳහා දින 05 ක කාලයක් ප්‍රමාණවත් නොවූ නිසා පුත්තලම දිස්ත්‍රික්කයේ නිලධාරීන් සඳහා සකස් කල වැඩසටහන දින 06 ක් සඳහා සකස් කෙරිණ. පුහුණු වැඩසටහන පවත්වන ලද්දේ 2007 දෙසැම්බර් මස 13 දින සිට 18 දින දක්වා හලාවත, දැදුරුඔය පිහිටි 'සංහිඳියාව' සදහම් නිකේතනයේ දී ය.

පුහුණු වැඩසටහන්වල නිමැවුම වූයේ සහභාගිත්ව ගැමි පිවිසුම් ක්‍රමය උපයෝගී කර ගනිමින් ප්‍රජා ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමට හැකි නිලධාරීන් 77ක පිරිසක් බිහි කිරීමය. එයට අමතරව, ක්ෂේත්‍ර කාර්යයන් සඳහා තෝරා ගත් ගම් 06 ක් සඳහා කෘෂිකාර්මික සංවර්ධනය පිණිස සකස් කරනු ලැබූ ආදර්ශ සැලසුම් 06ක් ද මෙහි දී සකස් කෙරිණි. මෙම ආදර්ශ සැලසුම් 06 මෙන්ම ඊට අමතරව, එම ක්ෂේත්‍ර අධ්‍යයන පැවති ගම්වලින් ලබා ගන්නා ලද අනෙකුත් දත්ත සහ තොරතුරු ද උපයෝගී කර ගනිමින් වාර්තා 06ක් ආයතනය විසින් සකස් කරන ලදී. මෙම වාර්තා පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ සියලුම නිලධාරීන්ට මෙන්ම අදාල ප්‍රාදේශීය ලේකම්වරුන්ට ද, මතු ප්‍රයෝජනය සඳහා ලබා දීමට හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනය කටයුතු කරන ලදී.

## 2. සමාජ සජීවීකරණය පිළිබඳව වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ වාරි කළමනාකරණ අංශයේ "වාරි පුබුදුව" ව්‍යාපෘතියේ සමාජ සජීවීකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන.

**සම්බන්ධීකාරක:** ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා - අංශ ප්‍රධාන/මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය

වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යාංශයේ, වාරිමාර්ග කළමනාකරණ අංශයේ "වාරි පුබුදුව" ව්‍යාපෘතිය දැනට කුරුණෑගල, අනුරාධපුරය, පුත්තලම සහ මාතලේ යන දිස්ත්‍රික්කවල මේ වන විට ක්‍රියාත්මක වේ. මෙම දිස්ත්‍රික්කයන්හි ගොවීන් දැනට මුහුණපා ඇති ගැටලු වලට විසඳුමක් වශයෙන් කෘෂිකර්මය, ජල කළමනාකරණය, ගොවි සංවිධාන, ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්, අලෙවිකරණය ආදී ක්ෂේත්‍රයන් කිහිපයක් සඳහා සංවර්ධන සැලසුම් මෙම ව්‍යාපෘතිය සකස් වේ.

ව්‍යාපෘතියේ අරමුණක් වන තිරසර පැවැත්මක් ඇති ගොවි සංවිධාන ගොඩනැඟීම සඳහා පවතින ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ අරමුණින් සමාජ සජීවීකරුවන් 184 දෙනෙකු ව්‍යාපෘතියට අලුතින් බඳවා ගැනීමට කටයුතු කරන ලදී. මෙහි පළමු කණ්ඩායම වශයෙන් සමාජ සජීවීකරුවන් 36 දෙනෙකු 2007 ජුලි මාසයේ දී ද, දෙවන කණ්ඩායම වශයෙන් සමාජ සජීවීකරුවන් 31 දෙනෙකු 2007 සැප්තැම්බර් මාසයේ දී ද ව්‍යාපෘතියට බඳවා ගන්නා ලදී.

'වාරි පුබුදුව' ව්‍යාපෘතිය සහ වාරිමාර්ග කළමනාකරණ අංශයේ අනුග්‍රහය මත මෙම සමාජ සජීවීකරුවන් පුහුණුකිරීමේ කාර්යය හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ,

මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය වෙත පැවරුනි. මෙම පුහුණුකිරීම් 2007 ජූලි මස ආරම්භ වී 2007 අවසන් වන විට නියමිත අයුරින් ගිවිසුම් ප්‍රකාරව නිමාවට පත් විය. මෙම පුහුණු කාර්යය සඳහා තිරසර කෘෂිකාර්මික සංවර්ධනයක් උදෙසා ගොවිජන සහභාගිත්වය කෙසේ, කුමන ආකාරයෙන්, කවර පරිසරයක් තුළ ලබා ගත යුතු ද හා සමාජ සජීවීකරුවකු ලෙස තම කාර්යභාරය හා ඒ සඳහා තිබිය යුතු දැනුම, ආකල්ප සහ කුසලතා මොනවාද යන කරුණු ඇතුලත්ව තම ගම තුළ සමාජ සජීවීකරුවන් ක්‍රියා කළයුතු ආකාරය පදනම් කරගත් පුහුණු වැඩසටහනක් ආයතනය විසින් සකස් කරන ලදී. දින 05ක් වන මෙම පුහුණු වැඩසටහනේ පොදු පරමාර්ථය වූයේ දැනට පවත්නා ගොවි සංවිධාන වඩාත් ශක්තිමත් කිරීමට මෙන්ම විවිධ ක්ෂේත්‍ර තුළින් ලබා ගත හැකි අනුග්‍රහයන් ගොවි සංවිධානය වෙතට ලබා ගැනීමට ගොවීන් පෙළඹවීම, සංවිධානය තුළ සංවර්ධනයට ඇති ගැටලු සහ අවහිරතා අඩු කිරීමට කටයුතු කිරීම හා "වාරි පුබුදුව" ව්‍යාපෘතිය සහ ගොවි සංවිධානය අතර ඇති සමීප බව වඩාත් ශක්තිමත් කිරීමට අවශ්‍ය දැනුම, නිවැරදි ආකල්ප මෙන් ම කුසලතාවයන් ද පුහුණු වන්නන් හට ලබා දීම යි.

මෙහි පළමු පුහුණු වැඩසටහන සමාජ සජීවීකරුවන් 36 දෙනෙකු සඳහා 2007 ජූලි මස 30 සිට අගෝස්තු මස 03 දින දක්වා අනුරාධපුර සර්වෝදය පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී. දෙවන පුහුණු වැඩසටහන සමාජ සජීවීකරුවන් 31 දෙනෙක් සඳහා 2007 සැප්තැම්බර් මස 10 දින සිට 14 දින දක්වා වාරියපොළ වයඹ පුහුණු ආයතනයේ දී පවත්වන ලදී.

මේ සඳහා මූල්‍ය දායකත්වය සපයන ලද්දේ අනුරාධපුර සහ කුරුණෑගල දිස්ත්‍රික්කයන් හි 'වාරි පුබුදුව' ව්‍යාපෘතිය මගිනි. පුහුණු වැඩසටහන්වල නිමැවුම වූයේ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම සඳහා කටයුතු කළ හැකි, ගොවි සංවිධානවලට අවශ්‍ය සේවාවන් සපයා ගැනීම සඳහා උපදෙස් දීමට මෙන්ම කටයුතු කිරීමට ද හැකි ගොවි සංවිධාන අතර සිරස් හා තිරස් සම්බන්ධතා බිහිකළ හැකි සමාජ සජීවීකරුවන් 6ක කණ්ඩායමක් වාරි පුබුදුව ව්‍යාපෘතියට හිමි වීම යි.

## ඡායාරූප සහ ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණ ක්‍රියාකාරකම්

මෙම අංශය මගින් ආයතනයේ පර්යේෂණ කටයුතු මෙන්ම පුහුණු කටයුතුවලට අදාළ ඡායාරූප මෙන්ම ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයන් සකස් කිරීම සිදු කරනු ලබයි. ආයතනයට අමතරව ආයතනයේ සම්මන්ත්‍රණ ශාලාවන්හි පැවැත්වෙන, වෙනත් ආයතනවල වැඩමුළු/සම්මන්ත්‍රණ ආදිය සඳහා ද ඒ අයගේ අවශ්‍යතාවය අනුව මෙම සේවය ලබා දෙනු ලැබේ. ආයතනය මගින් පවත්වනු ලබන සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු වැඩසටහන් මෙන්ම පර්යේෂණ කටයුතුවල විවිධ අවස්ථා ද ඡායාරූප ගත කිරීම මෙන්ම අවශ්‍ය පරිදි ශ්‍රව්‍ය දෘශ්‍ය නිර්මාණයන් සකස් කිරීම මෙමගින් සිදු වේ.

## 2007 දෙසැම්බර් 31 වැනි දිනට කාර්ය මණ්ඩල තත්ත්වයන්

| | 2006.12.31 දිනට තත්ත්වය | වසර තුළ සේවය අස්වීම් හෝ ඉල්ලා අස්වීම් | පත්වීම් | 2007.12.31 දිනට තත්ත්වය |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ | 1 | - | - | 1 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ) | 1 | - | - | 1 |
| අංශ ප්‍රධාන | 6 | - | - | 6 |
| පර්යේෂණ කාර්ය මණ්ඩලය | 27 | 2 | - | 25 |
| පරිපාලන කාර්ය මණ්ඩලය | 4 | | 3 | 7 |
| පුස්තකාලය - ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය | 2 | - | - | 2 |
| දත්ත සංවර්ධන ඒකකය | 2 | - | - | 2 |
| පරිඝනක ඒකකය | 2 | - | - | 2 |
| ප්‍රකාශන ඒකකය | 2 | 1 | - | 1 |
| සංඛ්‍යාන කාර්ය මණ්ඩලය | 25 | - | - | 25 |
| තාක්ෂණ කාර්ය මණ්ඩලය | 1 | - | - | 1 |
| ලිපිකාර, ලේකම් කටයුතු හා සමාන්තර ශ්‍රේණි | 49 | 2 | 4 | 51 |
| ක්‍රියාකරවන්නන් සහ ආශ්‍රිත ශ්‍රේණි | 36 | 2 | 4 | 38 |
| **සම්පූර්ණ සංඛ්‍යාව** | **158** | **7** | **11** | **162** |

### කාර්ය මණ්ඩල සංවර්ධනය

පහත සඳහන් පර්යේෂණ නිලධාරීහු පශ්චාත් උපාධි අධ්‍යනයන්හි යෙදී සිටියහ.

| | | |
|---|---|---|
| එන්.පී.පී. සමන්ත මහතා | - | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (2006 දෙසැම්බර් සිට) |
| ඩබ්.එච්.ඩී. ප්‍රියදර්ශන මහතා | - | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (2006 දෙසැම්බර් සිට) |
| ඩී.ඩබ්.එස්.ඩී.කේ. සෙනෙවිරත්න මහත්මිය | - | පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයේ කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය (2006 දෙසැම්බර් සිට) |
| පී.සී.ජේ. ද සිල්වා මහතා | - | චීනයේ, වුහැන්හි විද්‍යා හා තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය (2007 සිට 2010 දක්වා) |

## ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ/වැඩමුළු/රැස්වීම් ආදිය සඳහා සහභාගීත්වය

අධි පර්යේෂක ආචාර්ය ඩබ්.එම්.පී.බී. ගිරාගම මහතා 2007 ජනවාරි 01 සිට 03 දක්වා ඉන්දියාවේ කල්කටා හි ජෙඩාවපුර් සරසවියේ පැවති පාරිසරික ආර්ථික විද්‍යාව ස්වභාවික සම්පත් සහ බල ශක්තිය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට "21 වෙනි සියවස සඳහා ශ්‍රී ලංකාවේ බලශක්ති සැලසුම්කරණය" මැයෙන් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

අධි පර්යේෂක ආචාර්ය ඩබ්.එම්.පී.බී. ගිරාගම මහතා 2007 මැයි02 සිට 05 දක්වා ඉරානයේ ටෙහෙරාන් හි පැවති සිව්වන ආසියානු කලාපීය සම්මන්ත්‍රණය සහ සහභාගීත්ව වාරිමාර්ග කළමනාකරණය පිළිබඳ දසවැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සහභාගීත්ව වාරිමාර්ග කළමනාකරණය පිළිබඳව පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

අධි පර්යේෂක එම්.එම්.එම්. අහියර් මහතා 2007 මැයි 02 සිට 05 දක්වා ඉරානයේ ටෙහෙරාන් හි පැවති සිව්වන ආසියානු කලාපීය සම්මන්ත්‍රණය සහ සහභාගීත්ව වාරිමාර්ග කළමනාකරණය පිළිබඳ දසවැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට "මහා පරිමාණ වාරිමාර්ග කළමනාකරණය තුළ පාංශු ජල වෙන් කිරීම" යන මැයෙන් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී.

වී.කේ. නානායක්කාර මහතා 2007 මැයි 28 සිට ජුනි 02 දක්වා පිලිපීනයේ මැනිලා හි පැවති ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ආසියානු පැසිපික් කලාපීය මධ්‍යස්ථානයේ (CIRDAP) 26 වෙනි විධායක කමිටු රැස්වීමට සහ දසවැනි පාලක සභා රැස්වීමට සහභාගී විය.

අධි පර්යේෂක ආචාර්ය එල්.පී. රූපසේන මහතා 2007 ජුනි 09 සිට 15 වෙනි දින දක්වා ඉන්දියාවේ කෘෂි විද්‍යා විශ්වවිද්‍යාලයේ පැවති උපාධි ප්‍රධානෝත්සවයට සහභාගී විය.

ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිණී ආචාර්ය ඩබ්.ඩී. වික්‍රමසිංහ මහත්මිය 2007 ජුනි 05 සිට 15 වැනි දින දක්වා ජර්මනියේ ගීසන් විශ්වවිද්‍යාලයේ (DADD) ආදි ශිෂ්‍යයන්ගේ ජර්මානු ශාස්ත්‍රීය හුවමාරු වැඩසටහන යටතේ පැවති රැස්වීමට සහභාගී විය.

අධි පර්යේෂක ටී.ජේ. ධර්මරත්න මහතා 2007 ජූලි 02 සිට 11 දක්වා ඉන්දියාවේ හයිද්‍රබාද්හි පැවති ආසියා පැසිපික් කලාපයේ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතීන් හි සැලසුම්කරණය, විශ්ලේෂණය සහ ඇගයීම පිළිබඳ කලාපීය පුහුණු වැඩසටහනට සහභාගී විය.

සහාය අධි පර්යේෂක එම්.එම්.එම්. අහියර් මහතා 2007 අගෝස්තු 26 සිට 29 දක්වා චීනයේ ඩොන්ෂෙං හි පැවති "තිරසාර සනීපාරක්ෂාව සහ පරිසර හිතකාමී නගර හා ගම්මාන" සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය සඳහා "ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය දිරාපත්වීම : කොළඹ නගර සහා බල ප්‍රදේශය තුළ අත්දැකීම්" මැයෙන් පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

වී.කේ. නානායක්කාර මහතා 2007 අගෝස්තු 18 සිට 24 දක්වා තායිලන්තයේ පැවති ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ ආසියානු පැසිපික් කලාපීය මධ්‍යස්ථානයේ (CIRDAP) 23 වෙනි නිත්‍ය රැස්වීමට සහභාගී විය.

පර්යේෂණ නිලධාරී ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා 2007 සැප්තැම්බර් 03 සිට 21 දක්වා තායිලන්තයේ පැවති "ආහාර සුරක්ෂිතතාවයට අනුව පාරිසරික සෞඛ්‍ය" නම් පුහුණු වැඩසටහනට සහභාගී විය.

සහාය අධි පර්යේෂක ආර්.එල්.එන්. ජයතිස්ස මහතා 2007 ඔක්තෝබර් 22 සිට 31 දක්වා ඉන්දුනීසියාවේ බේලි හි පැවති "ව්‍යවසාය ප්‍රවර්ධනය ඔස්සේ කාන්තා සවිබල ගැන්වීම සහ සංවර්ධනය" පිළිබඳ පුහුණු වැඩසටහනට සහභාගී විය.

අධි පර්යේෂක ටී.ජේ. ධර්මරත්න මහතා 2007 ඔක්තෝබර් 22 සිට 24 දක්වා චීනයේ පැවති "කෘෂිකර්ම සංඛ්‍යානය පිළිබඳ උසස් සංඛ්‍යාන ඒකාබද්ධතාවය සහ විශ්ලේෂණය" පිළිබඳ සිව්වන ජාත්‍යන්තර සම්මන්ත්‍රණයට සහභාගී විය.

අධි පර්යේෂක ආචාර්ය ඩී. ගමගේ 2007 නොවැම්බර් 12 සහ 13 දිනයන් හි පැවති ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වන ආසියා පැසිපික් කලාපීය මධ්‍යස්ථානයන්ට අයත් රටවල් පැරණි ප්‍රතිපත්ති ඇගයුම පිළිබඳ වැඩසටහනට සහභාගී විය.

පර්යේෂණ නිලධාරී එන්.එස්.බී. ඇපාකන්ද මහතා 2007 දෙසැම්බර් 10 සිට 19 දක්වා නේපාලයේ පැවති නිලධාරීන් සහ රාජ්‍ය නොවන සංවිධාන සඳහා යහපත් පහසුකම් සැපයීමේ හැකියාවන් පිළිබඳ පුහුණු වැඩසටහනට සහභාගී විය.

## හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

## 2007.12.31 දිනට ශේෂ පත්‍රය

| | | 2007 | | 2006 | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | සටහන | රු. | රු. | රු. | රු. |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල පිරියත හා උපකරණ | 2 | 28,934,899.47 | | 26,390,241.68 | |
| ආයෝජන ස්ථාවර තැන්පතු | 3 | 5,769,437.21 | | 5,389,096.12 | |
| භාණ්ඩාගාර බිල්පත් | | 4,372,095.10 | | 4,372,095.10 | |
| කාර්ය මණ්ඩල සුභසාධනය | 4 | 18,654,480.34 | | 17,953,192.49 | |
| **එකතුව** | | | 57,730,912.12 | | 54,104,625.39 |
| **ජංගම වත්කම්** | | | | | |
| තොග | 5 | 3,330,316.99 | | 2,919,244.48 | |
| ණය ගෙවීම් | | 2,689,006.40 | | 2,481,323.64 | |
| ණය ගැතියෝ | 6 | 28,619,109.10 | | 30,467,154.13 | |
| තැන්පතු | 7 | 612,070.00 | | 612,070.00 | |
| ඉදිරි ගෙවීම් හා ලැබිය යුතු ගෙවීම් | 8 | 424,128.35 | | 258,616.29 | |
| අත්තිකාරම් | 9 | 471,568.86 | | 352,035.48 | |
| බැංකු ශේෂය | 10 | 15,711,407.20 | | 11,335,674.55 | |
| අතැති මුදල් | | 10,000.00 | | 10,000.00 | |
| | | | 51,867,606.90 | | 48,436,118.57 |
| **මුළු වත්කම්** | | | 109,598,519.01 | | 102,540,743.96 |
| **හිමිකම් හා වගකීම්** | | | | | |
| **ප්‍රාග්ධන සහ සංචිත** | | | | | |
| රජයේ මූලධන ප්‍රදානය | 11 | 105,841,900.00 | | 98,355,900.00 | |
| ඉතිරි කිරීම් වල දායකත්වය | | 1,102,372.79 | | 1,102,372.79 | |
| අමාත්‍යාංශයෙන් ලද ප්‍රාග්ධන දීමනා | | 2,342,835.00 | | 2,342,835.00 | |
| ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල | 12 | 14,886,206.09 | | 14,757,706.09 | |
| ප්‍රාග්ධන සංචිත | | 3,242,284.40 | | 3,242,284.40 | |
| ව්‍යාපෘති පොදු සංචිත | 13 | 16,524,437.47 | | 16,524,437.47 | |
| දිරිදීමනා අරමුදල | | 137,061.91 | | 137,061.91 | |
| දිරිදීමනා අරමුදල - ව්‍යාපෘති | | 138,210.72 | | 138,210.72 | |
| පුහුණු අරමුදල - ව්‍යාපෘති | | 396,261.91 | | 396,261.91 | |
| දිරිදීමනා අරමුදල ආයතනයේ කොටස | | 501,835.86 | | 501,835.86 | |
| ශුද්ධ ඌනතාවය ඉදිරියට ගෙනගියා | 14 | (76,599,261.14) | | (75,789,105.48) | |
| **එකතුව** | | | 68,514,145.01 | | 61,709,800.67 |
| **වගකීම්** | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂික වෙන් කිරීම් | | 29,618,437.52 | | 27,999,536.69 | |
| | | | 29,618,437.52 | | 27,999,536.69 |
| **ජංගම වගකීම්** | | | | | |
| ණය හිමියෝ | 15 | 6,577,298.00 | | 5,157,980.23 | |
| ගෙවිය යුතු ණය | | 2,689,006.40 | | 2,481,323.64 | |
| උපචිත වියදම් | | 2,199,632.09 | | 5,192,102.73 | |
| **එකතුව** | | | 11,465,936.49 | | 12,831,406.60 |
| **මුළු හිමිකම් හා වගකීම්** | | | 109,598,519.02 | | 102,540,743.96 |

සභාපති                    අධ්‍යක්ෂ                    ගණකාධිකාරී

## හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

## 2007.12.31 වැනි දිනට ආදායම් හා වියදම් ගිණුම්

| | සටහන් | 2007<br>රු. | 2006<br>රු. |
|---|---|---|---|
| **ආදායම** | | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලද අරමුදල | | 88,900,000.00 | 64,140,000.00 |
| නේවාසිකාගාර හා සම්මන්ත්‍රණ ශාලා පහසුකම් | 16 | 9,093,112.10 | 5,561,987.98 |
| ප්‍රකාශන අලෙවිය | | 93,493.29 | 184,685.25 |
| ආයෝජන පොළිය | | 741,160.52 | 653,234.12 |
| කාර්ය මණ්ඩල ණය පොළිය | | 794,921.16 | 630,455.75 |
| ව්‍යාපෘති පුනරාවර්තන දායකත්වය | 17 | 1,706,925.11 | 2,484,884.70 |
| විවිධ ආදායම් | 18 | 490,132.12 | 772,122.22 |
| | | **101,819,744.30** | **74,427,370.02** |
| **වියදම** | | | |
| පරිපාලන හා ආයතන වියදම් | 19 | (102,097,495.61) | (84,235,168.15) |
| බොල් ණය ඌණ වෙන් කිරීම | | (504,581.36) | 46,501.53 |
| **මූල්‍ය පිරිවැයට පෙර මෙහෙයුම් වලින් ශුද්ධ ආදායම** | | **(782,332.67)** | **(9,761,296.60)** |
| මූල්‍ය පිරිවැය | | (27,822.99) | (23,000.00) |
| **බදුවලට පෙර ශුද්ධ හිගය** | | **(810,155.66)** | **(9,784,296.60)** |
| බදු | | | |
| **බදුවලින් පසු අතිවිශේෂ අයිතම්වලට පෙර ශුද්ධ ආදායම** | | **(810,155.66)** | **(9,784,296.60)** |
| අති විශේෂ අයිතම | | - | - |
| **ආදායම ඉක්ම වු වියදම** | | **(810,155.66)** | **(9,784,296.60)** |

සභාපති　　　　අධ්‍යක්ෂ　　　　ගණකාධිකාරිණී

# හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

## 2007.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | සටහන | 2007 රුපියල් | |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය ලැබීම්** | | | |
| වර්ෂය සඳහා ශුද්ධ හිඟය | | | (810,155.66) |
| **ගැලපීම්** | | | |
| ක්ෂයවීම් සඳහා | | 4,023,313.59 | |
| ආයෝජන ආදායම | | (741,160.52) | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 4,445,852.74 | |
| පාරිතෝෂික ගෙවීම් | | (2,826,951.91) | 4,901,053.90 |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය** | | | **4,090,898.24** |
| **කාරක ප්‍රාග්ධන වෙනස්වීම්** | | | |
| තොග | | (411,072.51) | |
| ණයගැතියන් | | 1,848,045.03 | |
| තැන්පතු | | (165,512.06) | |
| ඉදිරි ගෙවීම් හා ලැබිය යුතු ගිණුම් | | (119,533.38) | |
| අත්තිකාරම් | | 1,419,317.77 | |
| ණයහිමියන් | | (2,992,470.64) | (421,225.79) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල්** | | | **3,669,672.45** |
| **ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල්** | | | |
| දේපල යන්ත්‍ර සහ උපකරණ මිල දී ගැනීම් | | (6,567,971.38) | |
| ස්ථාවර තැන්පතු | | 741,160.52 | |
| කාර්ය මණ්ඩල සංවර්ධන වියදම් | | (701,287.85) | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල් භාවිතය** | | | **(6,528,098.71)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහ** | | | |
| රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රතිපාදන | | 7,486,000.00 | |
| ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල | | 128,500.00 | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ශුද්ධ මුදල්** | | | **7,614,500.00** |
| **මුදල් සහ මුදල් සමාන අනෙකුත් අයිතම්වල ශුද්ධ වැඩිවීම්** | | | **4,756,073.74** |
| **වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන අයිතම්** | 1 | | **21,106,865.77** |
| **වර්ෂය අවසානයේ මුදල් සහ මුදල් හා සමාන අයිතම්** | 11 | | **25,862,939.51** |

සටහන්

| **මුදල් හා මුදල් හා සමාන අයිතම්** | **1**<br>**01.01.2007** | **11**<br>**31.12.2007** |
|---|---|---|
| ආයෝජන ස්ථාවර තැන්පතු | 5,389,096.12 | 5,769,437.21 |
| භාණ්ඩාගාර බිල්පත් | 4,372,095.10 | 4,372,095.10 |
| බැංකු ශේෂය | 11,335,674.55 | 15,711,407.20 |
| අතැති මුදල් | 10,000.00 | 10,000.00 |
| **එකතුව** | **21,106,865.77** | **25,862,939.51** |

# 2007 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා හිමිකම් වෙනස් වීම් ප්‍රකාශනය

| | රජය ප්‍රදානය කළ මූලධනය<br>රු. | ඉතුරුම්වල දායකත්වය<br>රු. | අමාත්‍යාංශයෙන් ලද මූලධන දායකත්වය<br>රු. | ව්‍යාපෘතියෙහි මූලධන අරමුදල්<br>රු. | මූලධන සංචිත<br>රු. | ව්‍යාපෘති සාමාන්‍ය සංචිත<br>රු. | දිරි දිමනා අරමුදල්<br>රු. | දිරි දිමනා අරමුදල් ව්‍යාපෘති<br>රු. | පුහුණු අරමුදල් ව්‍යාපෘතිය<br>රු. | දිරිදිමනා අරමුදල් ආයතනයේ කොටස<br>රු. | සමුච්චිත ආදායම<br>රු. | එකතුව<br>රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2007.01.01 දිනට ශේෂය | 98,355,900.00 | 1,102,372.79 | 2,342,835.00 | 14,757,706.09 | 3,242,284.40 | 16,524,437.47 | 137,061.91 | 138,210.72 | 396,261.91 | 501,835.86 | (75,789,105.48) | 61,709,800.67 |
| මහා භාණ්ඩාගාරයෙන් ලැබුනු මුදල් | 7,486,000.00 | - | - | | - | | - | - | - | - | - | 7,486,000.00 |
| ව්‍යාපෘති දායකත්වය | - | - | - | 128,500.00 | - | | - | | - | | - | 128,500.00 |
| ආදායම සහ වියදම | - | - | - | | - | | - | - | - | - | (810,155.66) | (810,155.66) |
| එකතුව | 105,841,900.00 | 1,102,372.79 | 2,342,835.00 | 14,886,206.09 | 3,242,284.40 | 16,524,437.47 | 137,061.91 | 138,210.72 | 396,261.91 | 501,835.86 | (76,599,261.14) | 68,514,145.01 |

# ක්ෂය කළ හැකි වත්කම් ලේඛනය - 2007

| විස්තරය | 2007.01.01 දිනට පිරිවැය රු. | පෙර වර්ෂවල ගැලපුම් 2007 රු. | 2007.12.31 දිනට මුළු පිරිවැය රු. | 2007.01.01 දිනට සමුච්පිත ක්ෂය රු. | 2007 වර්ෂය සඳහා ක්ෂය රු. | 2007.12.31 දිනට සමුපිච්ත ක්ෂය රු. | 2007.12.31 දිනට ශුද්ධ අගය රු. |
|---|---|---|---|---|---|---|---|
| ඉඩම් | 1,716,667.00 | - | 1,716,667.00 | - | - | - | 1,716,667.00 |
| ගොඩනැඟිලි | 18,321,516.72 | 2,315,641.45 | 20,637,158.17 | 8,021,696.50 | 515,928.95 | 8,537,625.45 | 12,099,532,72 |
| උපකරණ/ලී බඩු | 29,833,007.05 | 2,002,878.25 | 31,835,885.30 | 22,549,139.60 | 1,846,490.54 | 24,395,630.14 | 7,440,255.17 |
| පරිඝනක | 16,267,676.87 | 1,305,836.25 | 17,573,513.12 | 14,118,317.53 | 1,199,616.23 | 15,317,933.76 | 2,255,579.36 |
| මෝටර් රථ | 8,293,855.88 | 267,000.00 | 8,560,855.88 | 8,293,806.88 | 53,400.00 | 8,347,206.88 | 213,649.00 |
| පොත් | 8,399,696.37 | 676,615.43 | 9,076,311.80 | 3,459,218.70 | 407,877.87 | 3,867,096.57 | 5,209,215.23 |
| සුභසාධන උපකරණ | 3,734.55 | - | 3,734.55 | 3,733.55 | - | 3,733.55 | 1.00 |
| එකතුව | 82,836,145.44 | 6,567,971.38 | 89,404,125.82 | 56,445,912.76 | 4,023,313.59 | 60,469,206.35 | 28,934,899.47 |

| සටහන් | | 31.12.2007 |
|---|---|---|
| 3 | **හෙ.කො.ගො.ප.පු. ආයෝජන - ස්ථාවර තැන්පතු** | |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පතු | 3,500,000.00 |
| | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ ස්ථාවර තැන්පතු | 2,269,437.21 |
| | (නිවාස ණය ක්‍රමය) | **5,769,437.21** |
| 4 | **කාර්ය මණ්ඩල සංවර්ධනය** | |
| | 2007.01.01 දිනට ශේෂය | 17,953,192.49 |
| | වසර තුළ දී කරන ලද ගැලපීම් | 701,287.85 |
| | | 18,654,480.34 |
| 5 | **තොගය** | |
| | ප්‍රකාශන හා සඟරා | 1,467,412.74 |
| | ලිපි ද්‍රව්‍ය හා අනෙකුත් පාරිභෝජනය කළ හැකිදේ | 1,561,979.25 |
| | අලෙවි සැල | 300,925.00 |
| | | **3,330,316.99** |
| 6 | **ණය ගැතියෝ** | |
| | **කාර්ය මණ්ඩල ණය ගැතියෝ** | |
| | නිවාස ණය | 1,911,138.26 |
| | ඒකාබද්ධ ණය | 20,220,057.16 |
| | උත්සව අත්තිකාරම් | 95,510.00 |
| | අවතැන් වූ පුද්ගලයින්ගෙන් අයවිය යුතු | 6,723.32 |
| | වැටුප් අත්තිකාරම් | 1,590,645.52 |
| | ශිෂ්‍යත්ව ලාභීන්ගේ ණය | 28,630,016.14 |
| | | **52,454,090.40** |
| | **වෙනත් ණය ගැතියෝ** | |
| | නේවාසිකාගාර සහ ශ්‍රවණාගාර/සම්මන්ත්‍රණ ශාලා | 199,020.00 |
| | භාණ්ඩාගාර බිල්පත්වලින් ලැබිය යුතු පොලිය | 161,886.95 |
| | ලැබිය යුතු ආයෝජන ආදායම් | 169,756.54 |
| | විවිධ ණයගැතියෝ | 187,881.75 |
| | සේවාස්ථ පුහුණු ආයතනයෙන් ලැබිය යුතු | 6,806.38 |
| | කේ.එන්.යු. ගුණසේකරගෙන් ලැබිය යුතු | 12,100.00 |
| | කෘෂිකර්ම සංවර්ධන ආයතනයෙන් ලැබියුතු | 124,384.37 |
| | ඉවත් වූ සේවකයන්ගෙන් ලැබිය යුතු | 247,848.47 |
| | අලෙවි සැල | 34,342.00 |
| | | **1,144,026.46** |
| | **ව්‍යාපෘති අත්තිකාරම්** | |
| | සර්වේප් ලැබීම් | 174,900.00 |
| | ආර්-323 බලය බෙදා හැරීම ශ්‍රී ලංකාවේ සුළු පරිමාන කෘෂි අංශය කෙරෙහි බලපෑම | 8,967.70 |
| | ආර්- 327 HARTI Agricultural commodities revie ආහාර ද්‍රව්‍ය විමසුම | 136,410.47 |
| | ආර්-333 ශ්‍රී ලංකාවේ දෙවන බහු වාර්ෂික බෝග සංවර්ධන ව්‍යාපෘතියේ බලපෑම ඇස්තමේන්තු කිරීම පිළිබඳ අධ්‍යයනය | 20,897.80 |
| | ආර්-335 පෝෂණ ප්‍රවර්ධනය සඳහා ආහාර පරිභෝජන රටාවන් සංවර්ධනයට සාම්ප්‍රදායික ආහාර පදනම් කොටගත් නිෂ්පාදන සහ අලෙවි ප්‍රතිපත්තීන් පිළිබඳ අධ්‍යයනය | 1,581.00 |
| | ආර්-336 වෙහෙරගල ව්‍යාපෘතිය තුළ ජල භාවිතය පිළිබඳ අධ්‍යයනය | 34,267.78 |
| | ආර්-337 ශ්‍රී ලංකාවේ මතුපිට ආපදා වැසි දිය භාවිතය පිළිබඳ ඇස්තමේන්තුවක් | 260,473.46 |
| | ආර්-339 පොහොර සහනාධාරය ලබාදීම පිළිබඳව පවතින වැඩසටහනට විශේෂ අවධානය යොමු කරමින් සුළු පරිමාණ කෘෂි අංශයේ පොහොර සහනාධාර ප්‍රතිපත්තිය ඇගයීම | 350,447.28 |
| | ආර්-341 ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ වගා අංශයේ කෘෂි හා ගොවිජන පරිවර්තනය, පවතින තත්ත්වයන් සහ නව ප්‍රවනතා පිළිබඳ වාත්සවික අධ්‍යයනයක් | 1,148,615.02 |
| | | **2,136,560.51** |

| | |
|---|---|
| මුළු ගැතියෝ | 55,734,677.37 |
| **අඩු කළා** | |
| බොල් ණය සහ අඩමාන ණය වෙන්කිරීම් | (2,229,387.09) |
| ණය හිමියන් (බැඳුම්කර) වෙන්කිරීම් | (110,373.69) |
| ශිෂ්‍යත්ව සඳහා වෙන්කිරීම | (24,775,807.49) |
| | **28,619,109.10** |
| **7 තැන්පතු** | |
| ස්ථාවර - භෝජනාගාර හිමිකරු | 20,000.00 |
| ස්ථාවර - මුදල් හිමිකරු | 1,500.00 |
| විවිධ - ෆිලික්ස් පෙරේරා සහ පුත්‍රයෝ | 147,500.00 |
| විවිධ - ශ්‍රී ලංකා ටෙලිකොම් | 3,125.00 |
| විවිධ - තැපැල්පති | 24,945.00 |
| විවිධ - කොළඹ ගෑස් හා ජල සමාගම | 4,750.00 |
| විවිධ - ජල සම්පාදන හා ජල පවාහන මණ්ඩලය | 500.00 |
| විවිධ - සෙල්ටෙල් ලංකා | 3,500.00 |
| විවිධ - ලංකා විදුලිබල මණ්ඩලය | 406,250.00 |
| | **612,070.00** |
| **8 ඉදිරි ගෙවීම් හා ලැබිය යුතු මුදල්** | |
| ඉදිරි ගෙවීම් | 424,128.35 |
| | **424,128.35** |
| **9 අත්තිකාරම්** | |
| මිල දී ගැනීම් සඳහා අත්තිකාරම් | 124,269.86 |
| වෙනත් දේ සඳහා අත්තිකාරම් | 347,299.00 |
| | **471,568.86** |
| **10 බැංකුවෙහි ඇති මුදල්** | |
| ලංකා බැංකුව ගිණුම් අංකය - 2323293 | 2,049,245.11 |
| ලංකා බැංකුව ගිණුම් අංකය - 2323292 | 8,130,283.51 |
| ලංකා බැංකුව ගිණුම් අංකය - 2323317 | 4,782,555.46 |
| ලංකා බැංකුව ගිණුම් අංකය - 2323315 | 749,323.12 |
| | **15,711,407.20** |
| **11 රජයේ ප්‍රාග්ධන ප්‍රදාන** | |
| 2007.01.01 දිනට ශේෂය | 98,355,900.00 |
| වසර තුළ දී එකතු කිරීම් | 7,486,000.00 |
| | **105,841,900.00** |
| **12 ව්‍යාපෘති ප්‍රාග්ධන අරමුදල** | |
| 2007.01.01 දිනට ශේෂය | 14,757,706.09 |
| වසර තුළ දී එකතු කිරීම් | 128,500.00 |
| | **14,886,206.09** |
| **13 ව්‍යාපෘති සාමාන්‍ය සංචිතය** | |
| 2007.01.01 දිනට ශේෂය | 16,524,437.47 |
| වසර තුළ දී එකතු කිරීම් | - |
| | **16,524,437.47** |
| **14 ශුද්ධ හිගය** | |
| 2007.01.01 දිනට ශේෂය | (75,789,105.48) |
| 2007 වර්ෂය සඳහා ආදායම ඉක්ම වූ වියදම | (810,155.66) |
| | **(76,599,261.14)** |

| | | |
|---|---|---|
| **15** | **ණය හිමියන්** | |
| | ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් ගාස්තු | 117,712.20 |
| | නැවත ගෙවිය හැකි භෝජනාගාර තැන්පතු | 50,000.00 |
| | නොගෙවූ වියදම | 3,986.31 |
| | සේවක හා භෝජනාගාර තැන්පතු | 13,084.50 |
| | වෙනත් ණය හිමියන් | 105,987.52 |
| | | |
| | **ව්‍යාපෘතිවල ණය හිමියෝ** | |
| | සහල් නිෂ්පාදනය පිළිබඳ ග්‍රන්ථය | 1,318,838.39 |
| | ජී. 13 ගෘහාශ්‍රිත මට්ටමේ සහල් සැකසුම් ක්‍රියාවලියේ ආර්ථික සාධ්‍යතාවය (ආර් 324) | 42,726.80 |
| | ආයතනික සැපයුම්කරු | 18,941.40 |
| | රැකියාවෙන් ඉවත් වූ සේවක ගෙවීම් | 150,015.00 |
| | ආර්.300 සමෘද්ධි හා සමෘද්ධි නොවන සන්සන්දනාත්මක විශ්ලේෂණයක් | 234,996.50 |
| | ආර්. 318 ආහාර අනාරක්ෂිතභාවය හා එයට නැඹුරුවීමේ ඇති අවදානම පිළිබඳ තොරතුරු එකතු කිරීමේ හා සිතියම්ගත කිරීමේ ක්‍රියාවලිය | 291,895.99 |
| | ආර් - 322 වාරියපොල ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයන යෝජනා වලිය | 26,119.08 |
| | ආර් - 332 බස්නාහිර පළාතේ පොළ වෙළඳපොළ වර්ධනය කිරීමේ අධ්‍යයනය | 478,266.61 |
| | ටී. 294 ෆිව්මිස් | 217,946.87 |
| | ආර්-334 ශක්‍යතා අධ්‍යයනය - බලංගොඩ ප්‍රදේශයේ යෝජිත ආර්ථික මධ්‍යස්ථානය | 25,871.73 |
| | ආර්-344 සමාජ ආර්ථික සමීක්ෂණය - යෝජිත සීනි ව්‍යාපෘතිය | 167,552.72 |
| | ආර්-349 කිරි ගම්මාන සංවර්ධන ව්‍යාපෘතියේ අර්ධවාර ඇගයීම | 285,517.23 |
| | ටී-228 ගැටුම් පීඩිත ප්‍රදේශවල සංවර්ධන කාර්යයන් සඳහා ක්‍රමෝපායන් පිළිබඳ වැඩමුළුව | 1,227,360.49 |
| | ආර්-330 ශක්‍යතා අධ්‍යයනය - කුරුඳුවත්ත ප්‍රදේශයේ යෝජිත ආර්ථික මධ්‍යස්ථානය | 163,945.94 |
| | ටී.226 නිරවද්‍ය ජනිත කරවීමේ අවබෝධය පිළිබඳ ප්‍රජා සංවිධාන නායකයින් සඳහා වන වැඩමුළුව | 774,137.89 |
| | ටී-232 පුහුණු වැඩසටහන් | 830,930.37 |
| | ගෙවන මුද්දර ගාස්තු | 6,140.00 |
| | උපතිස්ස - භෝජනාගාර හිමිකරු | 25,324.46 |
| | | **6,577,298.00** |
| **16** | **ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා හා නේවාසිකාගාර ආදායම** | |
| | ශ්‍රවණාගාර හා සම්මන්ත්‍රණ ශාලා ආදායම | 5,517,585.60 |
| | නේවාසිකාගාර ආදායම | 3,575,526.50 |
| | | **9,093,112.10** |
| **17** | **ව්‍යාපෘති ආදායම** | |
| | පරිපාලන පිරිවැය | 1,706,925.1 |
| | | **1,706,925.11** |
| **18** | **විවිධ ආදායම්** | |
| | බංගලා ගාස්තු හා කාමර කුලී | 58,668.50 |
| | පැල්වෙහෙර කාමර කුලී | 24,400.00 |
| | පරිගනක ආදායම | 33,872.20 |
| | ටෙන්ඩර් ගාස්තු | 7,800.00 |
| | වෙනත් ආදායම් | 365,391.42 |
| | | **490,132.12** |
| **19** | **පරිපාලන සහ ආයතන වියදම්** | |
| | ස්ථිර කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම් | 47,032,875.24 |
| | අනියම් කාර්ය මණ්ඩල වැටුප් | 3,911,245.01 |
| | සේවක අර්ථසාධක අරමුදල | 7,500,075.22 |
| | සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල | 1,505,104.87 |
| | අතිකාල | 2,212,346.48 |
| | නිවාඩු දින ගෙවීම් | 23,940.36 |
| | වෙනත් දීමනා | 2,606,221.70 |
| | ජීවන වියදම | 4,445,852.74 |
| | සංයුක්ත දීමනා | 3,746,828.40 |

| | | |
|---|---|---|
| | දේශීය යැපීම් දීමනා | 281,178.44 |
| | දේශීය ප්‍රවාහන දීමනා | 1,004,032.82 |
| | විදේශීය ප්‍රවාහන දීමනා | 166,738.73 |
| | ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 1,459,931.93 |
| | වෙනත් පාරිභෝජන ද්‍රව්‍ය | 928,578.47 |
| | ඉන්ධන හා ලිහිසි තෙල් | 1,038,442.85 |
| | නිල ඇඳුම් | 33,787.00 |
| | වාහන අළුත් වැඩියා | 2,042,686.95 |
| | යන්ත්‍ර හා උපකරණ අළුත්වැඩියා | 660,882.78 |
| | ක්ෂයවීම් | 4,023,313.59 |
| | ගොඩනැගිලි අළුත්වැඩියා | 915,356.37 |
| | දුරකතන ගාස්තු | 1,662,180.38 |
| | විදුලිය | 2,943,822.32 |
| | ජල බිල්පත් | 247,566.20 |
| | වරිපනම් සහ බදු | 197,460.00 |
| | තැපැල් ගාස්තු | 251,629.00 |
| | ප්‍රවාහන ගාස්තු | 270,470.00 |
| | නීති උපදෙස් | 110,000.00 |
| | පරිගණක උපදේශක | 72,000.00 |
| | වාහන උපදේශක | 16,000.00 |
| | පුවත්පත් | 179,973.00 |
| | බලපත්‍ර හා රක්ෂණය | 447,474.25 |
| | ආරක්ෂක ගාස්තු | 1,975,889.37 |
| | පිරිසිදු කිරීමේ ගාස්තු | 340,415.06 |
| | රෙදි සේදීම | 183,600.00 |
| | විගණන ගාස්තු | 200,000.00 |
| | වෛද්‍ය රක්ෂණය | 166,780.94 |
| | ආපනශාලා ගාස්තු | 7,268.85 |
| | විවිධ වියදම් - පර්යේෂණ | 4,989,110.37 |
| | විවිධ වියදම් - වෙනත් | 568,419.67 |
| | නෛතික ගාස්තු | 893,690.00 |
| | වැඩමුළු වියදම් | 20,974.00 |
| | සුභ සාධන | 100,000.00 |
| | දැන්වීම් | 540,953.75 |
| | සම්මුඛ පරීක්ෂණ ගාස්තු | 5,600.00 |
| | පාලක මණ්ඩලය | 160,500.00 |
| | සංග්‍රහ | 6,298.50 |
| | | **102,097,495.61** |
| **20** | **වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් හා සමාන අයිතම්** | |
| | ආයෝජන හා ස්ථාවර තැන්පතු | 5,389,096.12 |
| | භාණ්ඩාගාර බිල්පත් | 4,372,095.10 |
| | බැංකු ශේෂ | 11,335,674.55 |
| | අතැති මුදල් | 10,000.00 |
| | | **21,106,865.77** |
| **21** | **වර්ෂය අවසානයේ දී මුදල් සහ මුදල් හා සමාන අයිතම්** | |
| | ආයෝජන - ස්ථාවර තැන්පතු | 5,769,437.21 |
| | භාණ්ඩාගාර බිල්පත් | 4,372,095.10 |
| | බැංකු ශේෂ | 15,711,407.20 |
| | අතැති මුදල් | 10,000.00 |
| | | **25,862,939.51** |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගෙ අංකය / My No. : එඑප්/ඩී/එච්ජ්ආර්ටීඅයි/2007
ඔබේ අංකය / உமது இல / Your No. :
දිනය / திகதி / Date : 2008 ජූලි 24 දින

සභාපති,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය .

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2008 අප්‍රේල් 07 දින ආයතනයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් ,යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්,අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්,මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් විය. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07, ශ්‍රී ලංකාව

சுதந்திர சதுக்கம்,
கொழும்பு 07, இலங்கை

INDEPENDENCE SQUARE,
COLOMBO 07, SRI LANKA

දුරකථනය / தொலைபேசி / Telephone. : 2691151

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 2697451

ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ மெயில் / E-mail. : oaggov@sltnet.lk

## 02. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව , **හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය** 2007 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර, 2007 දෙසැම්බර් 31 දිනට **හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ** ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

**ස්ථාවර වත්කම් වෙන වෙනම හඳුනා ගෙන ක්ෂය කළ යුතු වුවත් ගොඩනැගිලි සහ පුස්තකාල පොත් තනි ඒකකයක් වශයෙන් සලකා ක්ෂය කර තිබුණි.**

#### 2.2.2 ගණකාධිකරණ අඩුපාඩු

**ගොඩනැගිලි අලුත්වැඩියාව සඳහා දරන ලද රු.2,315,641 ක් වූ පුනරාවර්තන වියදම ප්‍රාග්ධනගත කර තිබුණි.**

#### 2.2.3 හඳුනා නොගත් ගනුදෙනු

**ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවල මුළු එකතුව රු.3,445,208 ක් වූ හඳුනා නොගත් ගනුදෙනු නිරීක්ෂණය වූ අතර ඒ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.**

#### 2.2.4 ලැබිය යුතු ගිණුම්

**සමාලෝචිත වර්ෂය අවසානයට අත්තිකාරම් සහ ණයගැති ශේෂවල (ශිෂ්‍යත්ව ලාභී ණයගැතියන් හැර) එකතුව රු.26,846,725 ක් වූ අතර එයින් රු.14,420,970 ක් වූ ශේෂ වර්ෂයකට වඩා වැඩි කාලයක සිට හිඟහිට පැවතිණ.**

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

විස්තරාත්මක උපලේඛන නොමැතිවීම නිසා ගිණුම්වල දැක්වෙන පහත සඳහන් විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම |
|---|---|
| | රු. |
| (අ).ඉඩම් | 1,716,667 |
| (ආ).ගොඩනැගිලි | 20,637,158 |
| (ඇ).පොත් | 9,076,312 |
| (ඇ).උපකරණ | 3,735 |
| එකතුව | 31,433,872 |

### 2.2.6 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වු අනුකූල නොවු අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි ආදියට යොමුව | විස්තර |
|---|---|
| (අ).1971 අංක 38 දරන මුදල් පනතේ 13 (8) වගන්තිය | මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාරව 2006 වර්ෂයට අදාලව නිකුත් කරන ලද වාර්තාවෙන් පෙන්වා දුන් කරුණු සම්බන්ධයෙන් ගනු ලැබු හෝ ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ).2001 පෙබරවාරි 06 දිනැති අංක 393 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව යතුරු පැදි දෙකක් බාහිර පාර්ශවයන්ට මුදා හැර තිබුණි. |
| (ඇ).1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | විධිමත් අයුරින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ).2006 අප්‍රේල් 20 දිනැති අංක 12 දරන මුද්දර බදු පනත | රු.70,000 ක් වු ගෙවීමක් සම්බන්ධයෙන් මුද්දර ගාස්තු අය කර නොතිබුණි. |

(ඉ).මුදල් රෙගුලාසි

| | |
|---|---|
| (i). අංක 756 | 2007 වර්ෂය සඳහා වූ වත්කම් සත්‍යාපන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii). අංක 802(3) | ආයතනය විසින් මුදල් රෙගුලාසිවල විධිවිධාන අනුව වාහන ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (iii). අංක 371 | එකතුව රු.1,662,616 ක් වූ අත්තිකාරම් , වර්ෂ 3 සිට 20 දක්වා වූ කාලපරිච්ඡේදයක් තිස්සේ පියවා නොතිබුණි. |

## 3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව , සමාලෝචිත වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් සඳහා වූ රජයේ දායකය ගණන් ගැනීමට පෙර රු.89,710,156 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.73,924,297 ක් විය. රු.88,900,000 ක් වූ රජයේ දායකය ගණන් ගැනීමෙන් පසුව, සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.810,156 දක්වා අඩු විය. රු.64,140,000 ක් වූ ඉකුත් වර්ෂයේ රජයේ දායකය ගණන් ගැනීමෙන් පසු එම වර්ෂයේ ඌනතාවය රු.9,784,297 දක්වා අඩු වූ හෙයින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,974,141 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

3.2 කාර්ය සාධනය

(අ) කොන්ත්‍රාත් පර්යේෂණ ප්‍රගතිය පිළිබඳ දත්ත පහත වගුවෙහි දැක්වේ.

| | 2007 වර්ෂය | 2006 වර්ෂය |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ සංඛ්‍යාව | 06 | 05 |
| <u>එකතු කළා</u> | | |
| වර්ෂය තුල ප්‍රදානය කළ සංඛ්‍යාව | 06 | 13 |
| | 12 | 18 |
| අඩු කළා | | |
| වර්ෂය තුල නිම කළ සංඛ්‍යාව | 03 | 12 |
| වර්ෂය අවසානයට නොනිමි වැඩ සංඛ්‍යාව | 09 | 06 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(ආ) පර්යේෂණ සහ ආර්ථික සහයෝගිතාවය සඳහා වූ ස්විඩන් නියෝජිතායතනයෙන් 1992 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ සහල් නිෂ්පාදනය පිළිබඳ ව්‍යාපෘතියකට එක්සත් ජනපද ඩොලර් 65,000 ක් ලැබී තිබුණි. 2007 දෙසැම්බර් 31 දක්වාම මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා රු.102,097,495 ක් වූ සේවක පඩිනඩි මුළු පුනරාවර්තන වියදම්වලින් 78% ක් විය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) පැල්වෙහෙර සංචාරක බංගලාවේ අයිතිය ලබා ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයෙන් දෙන ලද දැනට භාවිතයේ පවතින මෝටර් වාහන 05 ක් ආයතනයේ නමට මාරු කර ගෙන නොතිබුණි.

(ඇ) ණය මුදල් උපයෝගී කර ගෙන මිලදී ගෙන තිබුණු වත්කම් උකස් කිරීමට අදාල ලියකියවිලි ආයතනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) නිතිමය ක්‍රියාමාර්ග ගැනීමේ දී සහ අදාල තීරණ ගැනීමේදී වර්ෂ 3 සිට 18 දක්වා කාලයක් ප්‍රමාදවීම නිසා රු.28,630,016 ක් වූ ශිෂ්‍යත්වලාභී ණයගැති ශේෂ අය කර ගත නොහැකිව පැවතිණ.

3.4 ආර්ථික නොවූ ගනුදෙනු

අවම සැපයුම්කරු වෙත ඇණවුම ඉදිරිපත් නොකිරීම හේතුකොට ගෙන , ආයතනයට රු.83,000 ක පාඩුවක් වන පරිදි රු.245,000 ක් පිරිවැය වූ ලැප්ටොප් පරිගණකයක් මිලදී ගෙන තිබුණි.

3.5 නිශ්කාර්ය සහ ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිශ්කාර්ය සහ ඌන උපයෝජිත වත්කම් නිරීක්ෂණය විය.

| වත්කම | පොත් අගය | නිශ්කාර්ය කාලය | නිශ්කාර්යව පැවතීමට හේතු |
|---|---|---|---|
| | රු. | | |
| (අ).මෝටර් වාහන 05 | 1,439,952 | වර්ෂ 1 කට වැඩි | විශාල අලුත්වැඩියා |
| (ආ).ලී පුටු 40 | 20,000 | වර්ෂ 1 කට වැඩි | අලුත්වැඩියා කටයුතු |
| (ඇ).වාර්ෂික වාර්තා සහ පොත් රු.3,763 | ඉදිරිපත් නොකෙරුණි | වර්ෂ 02 කට වැඩි | - |

3.6 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බැව් පෙන්නුම් කෙරිණ.

04. පද්ධති සහ පාලන

---------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ). අත්තිකාරම් ගෙවීම සහ නිරවුල් කිරීම

(ආ). ව්‍යාපෘති ගිණුම්වලින් මුදල් මාරුකිරීම.

(ඇ). වාහන අලුත්වැඩියාව

(ඈ). බාහිර පාර්ශවයන්ගේ වත්කම්.

එස්.ස්වර්ණජෝති

විගණකාධිපති